2021

වැවිලි අමාත්‍යාංශය
பெருந்தோட்டக் அமைச்சு
Ministry of Plantation

පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය
தென்னை, கித்துல் மற்றும் பனை செய்கை மேம்பாடு மற்றும் அவை சார்ந்த கைத்தில் பண்டங்கள் உற்பத்தி மற்றும் ஏற்றுமதி பல்வகைப்படுத்தல் இராஜாங்க அமைச்சு
State Ministry of Coconut, Kithul and Palmyrah Cultivation Promotion and Related Industrial Product Manufacturing & Export Diversification



පොල් වගාකිරීමේ මණ්ඩලය
தென்னைப் பயிர்ச்செய்கைச் சபை
Coconut Cultivation Board

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

දැක්ම

ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත්ම කාර්යක්ෂම හා ඵලදායී පොල් නිෂ්පාදකයා කරවීම

இலக்கு

இலங்கையினை உலகத்தில் மிகவும் வினைத்திறனான மற்றும் உற்பத்தி திறனான தென்னை உற்பத்தியாளராக்குதல்

Vision

To make Sri Lanka globally the most efficient & effective Coconut Producer

මෙහෙවර

ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින්, ස්වයංපෝෂිත තත්ත්වය ළඟාකර ගැනීම පිණිස ඵලදායී උපදේශන හා ව්‍යාප්ති සේවාවක් මඟින් පොල් නිෂ්පාදනය ඉහළ නැංවීමත්, පොල් ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීමත් තුළින් පොල් වගාකරුවාට ඉහළ ජීවන මට්ටමක් සාක්ෂාත් කරවීම අපගේ මෙහෙවරයි

செயற்பணி

இலங்கையில் உள்நாட்டு நுகர்வுத் தேவை மற்றும் ஏற்றுமதித் தேவையினை பூர்த்தி செய்தல், சுயபோசணை நிலைமையினை நெருங்கும் பொருட்டு வினைத்திறனான மற்றும் உற்பத்தி திறனாக ஆலோசனையாளர் மற்றும் பரவலாக்கல் சேவையின் ஊடாக தென்னை உற்பத்தியினை உயர்த்துதலும், தென்னங் காணிகளில் உற்பத்தித் திறனினை உயர்த்துவதன் ஊடாக தென்னைப் பயிர்ச்செய்கையாளர்களுக்கு உயர்ந்த வாழ்க்கை மட்டத்தினை வழங்குவதும் எங்களது செயற்பணியாகும்

Mission

To achieve a high living standard to the coconut producer through increasing the coconut production by means of an effective advisory & extension service and development assistant to increase the productivity of coconut land while meeting the domestic consumer demand and export requirement

වාර්ෂික වාර්තාව

2021

අරමුණ

- පොල් පරිභෝජනය කරන්නන්ගේ හා සැකසුම්කරුවන්ගේ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන ලෙස ගෙඩි ඵලදාවේ තිරසාරභාවය තහවුරු කිරීම සඳහා පොල් ගස් ගහණය වැඩි කිරීම තුළින් පොල් ඵලදාව වැඩි කිරීම .
- සත්ත්ව පාලන / අතුරු බෝග විවිධාංගීකරණය හරහා පොල් ඉඩම්වල ඵලදායීතාවය හා ගොවිපළ ආදායම වැඩි කිරීම.
- පොල් වගාවේ මාධ්‍යම හා සුළු පරිමාණ වගාවන්හි පොල් ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි යොමුකරන වස් කුඩා ඉඩම් හිමියන් ප්‍රජා මුල සංවිධාන ගතකර ඔවුන් සඳහා රැකියා අවස්ථා ජනිතකර දිළිඳුකම පිටු දැකීම .
- චිරස්ථායී පොල් වගාවක් සඳහා කාබනික පොහොර යෙදීම ප්‍රවර්ධනය කිරීම.
- රටේ ආහාරමය හා කර්මාන්ත ඉල්ලුම සපුරාලීම සඳහා 2021 වන විට වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,383 දක්වා ඉහළ නැංවීම.
- පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියලු පොල් වතු ආදර්ශ පොල් උයන් තත්ත්වයට පත් කිරීම හා 2020 ආදායමට සාපේක්ෂව 2021 වන විට ලාභය 30%කින් වැඩි කිරීම.

ඉලක්ක

- සෑම පොල් වගාකරුවකු වෙතට පොල් වගාවේ තාක්ෂණික දැනුම ගෙන යාම හා කුසලතා වර්ධනය කිරීම.
- ඉල්ලුම පදනම්කරගත් ව්‍යාප්ති සේවාවන් පවත්වාගෙන යාම සහ උසස් තත්ත්වයේ යෙදවුම් ලබා දීම.
- ශ්‍රී ලංකාව තුළ තිරසාර පොල් වගාවක් ස්ථාපනය කිරීම.
- පොල් ඉඩම සඳහා සුදුසු අතුරුබෝග වගාකිරීමෙන් පොල් ඉඩම්වල උපයෝගීතාවය ඉහළ දැමීම .
- කප්රුක පුරවර වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීම.
- කාබනික හා අකාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- වගාකරුවන් දැනුවත් කිරීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් යොදා ගැනීම .
- ගෘහස්ථ පරිභෝජනයට, පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට හා විදේශීය වෙළඳපලට අවශ්‍ය වන පොල් ප්‍රමාණය රට තුළ නිෂ්පාදනය කිරීම.

හැඳින්වීම

පොල් වගාකිරීමේ මණ්ඩලය, 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ අංක 02 වගන්තිය යටතේ දිවයිනේ පොල් සංවර්ධනය අරමුණු කොට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් 1972 මාර්තු මස 30 වෙනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයකින් පිහිටුවනු ලැබීය.

2021 ජනවාරි මස 01 දින සිට 2021 දෙසැම්බර් 31 වෙනි දින දක්වා කාලය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මෙම වාර්තාවට ඇතුලත්කොට ඇත.

එකී පනත ප්‍රකාරව මණ්ඩලයේ කාර්යභාර්ය පහත දැක්වෙන අයුරු අර්ථ දක්වා ඇත.

- පොල් වගාකළ ඉඩම්වල ඵලදාව වර්ධනය කිරීම හා ඵලදාව වර්ධනය කිරීමෙහිලා සහාය වීම.
- ඉඩම්වල පොල් වගාකිරීම, ඒවා වගාකිරීම වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීමට සහාය වීම. (තෘණ ඇතුළුව) වෙනත් වගාවන්ගේ අතුරු වගාව සඳහා සුදුසු පොල් වගාකළ ඉඩම් තෝරා ගැනීම හා එකී ඉඩම්වල අතුරු වගා වැඩපිළිවෙල වැඩි දියුණු කිරීම, මෙහෙයවීම, පවත්වාගෙන යාමට සහාය වීම.
- පොල් වගාකළ ඉඩම්වල සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම හා විධිමත් කිරීම, ඊට සහාය වීම හා එහි නියුක්ත වීම.
- පොල් වගාකළ ඉඩම්වල පොල් හා වෙනත් බෝග වැවීම සම්බන්ධයෙන් නිසි වගා ක්‍රම විස්තර කිරීම, ජනප්‍රිය කිරීම, වැඩිදියුණු කිරීම හා මෙහෙයවීම.
- පොල් කර්මාන්තයට සහාය වීම, උපදේශක හා ව්‍යාප්ති සේවකයින් පුහුණු කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය 2021

1. ජයන්ත වික්‍රමසිංහ මහතා	(2020.02.17-2021.06.29)	සභාපති
2. ඒ.වී.කේ.මාධවී හේරත් මහත්මිය	(2021.07.06-)	සභාපති
3. ජේ.එම්.ටී. ජයසුන්දර මහත්මිය	(2020.01.26-2021.02.16)	අමාත්‍යාංශ නියෝජිත
4. ආර්.පී.කස්තුරිආරච්චි මහත්මිය	(2021.01.26-2022.10.07)	අමාත්‍යාංශ නියෝජිත
5. තරංගා ලියනගේ මහත්මිය	(2020.02.17-2022.02.26)	භාණ්ඩාගාර නියෝජිත
6. සුරේෂ් සිල්වා මහතා	(2020.01.27)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. ඒ.ඊ්.ප්‍රනාන්ඩුපුල්ලේ මහතා	(2020.01.27)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
8. සරත් එන්. පෙරේරා මහතා	(2020.01.17-2021.01.12)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
9. එස්.කේ.මලවිආරච්චි මහතා	(2020.02.27)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10. අනිල් කුමාර සේනාධීර මහතා	(2020.03.02-2022.08.25)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
11. චන්න පෙරේරා මහතා	(2021.01.19)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
12. මහේෂ් විදානගමගේ මහතා	(2021.01.19-2022.08.16)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
13. කීර්ති වීරසිංහ මහතා	(2021.09.17-2022.02.	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
14. සාරංග අලහප්පෙරුම මහතා	(2021.09.17-2022.08.28)	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
15. ආචාර්ය සනාතනී රණසිංහ මහත්මිය	2020.02.19	අධ්‍යක්ෂ - පොල් පර්යේෂණ ආයතනය
16. වෛද්‍ය සී.එස්.කේ. පෙරේරා මහතා.	2021.1.19	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
17. වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා	2021.09.17 - 2022.10.28	අධ්‍යක්ෂ මණ්ඩල නිරීක්ෂක

සභාපතිතුමියගේ පණිවිඩය



දශක පහකට ආසන්න කාලයක් පුරාවට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය පදනම් කරගත් දේශීය ආර්ථිකය වෙනුවෙන් විශාල කාර්යභාර්යක් ඉටු කරන ලද රාජ්‍ය ආයතනයකි. පසුගිය වසර කිහිපය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලය පොල් ක්ෂේත්‍රයට අදාළව ලබාගත් ජයග්‍රහණයන් වඩාත් ඉදිරියට ගෙනයමින් 2021 වර්ෂයේදීත්, පොල් වගාකරුවන්හට කැපීපෙනෙන සේවාවක් ලබාදීමට සමත්ව ඇත. 2021 වර්ෂයේ මුල් භාගය පුරාවට කෝවිඩ් වසංගත තත්ත්වය නිසා ඇතිවූ අභියෝගයන් හමුවේ නොසැලී ඉදිරියට යමින් පොල් ගෙඩි මිලියන 3,382ක වාර්ෂික පොල් අස්වැන්නක් ලබා ගනිමින් පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය තුළින් දේශීය ආර්ථිකයට ඇ.ඩොලර් මිලියන 836ක වාර්තාගත අපනයන ආදායමක් උපයාදීමට තම දායකත්වය ලබාදුන් වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ලබාදෙන ලද දායකත්වය අගය කළ යුතුවේ.

2021 වර්ෂයේදී පොල් වගාකිරීමේ මණ්ඩලය සඳහා ජාතික අයවැයෙන් රු.මි.900ක් වෙන්ව තිබූ අතර වසර අවසානය වන විට ඉන් රු.මිලි.734.294ක් ප්‍රතිපාදන ලෙස ලබා දී ඇත. 2021 වර්ෂයේදී ගුණාත්මකභාවයෙන් ඉහළ පොල් පැළ මිලියන 1.815ක් විවිධ සහනාධාර වැඩසටහන් හරහා ක්ෂේත්‍රයේ සිටුවීමට පොල් වගාකිරීමේ මණ්ඩලය සමත් විය. ගෘහස්ථ පරිභෝජනය මූලික කරගත් ගෙවතු වගා සඳහා දොරින් දොරට කජරුක හා සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන් යන විශේෂ වැඩසටහන් හරහා වගාකරුවන්හට පොල් පැළ ලබාදී වගාකරුවන් පොල් වගාව සඳහා උනන්දු කිරීම සිදු කරන ලදී. එමෙන්ම පොල් වගාවට අවශ්‍ය පාළු පැළ සිටුවීම, පෙර වසරවල සිටවූ පැළ ආරක්ෂණය සහ අතුරු බෝග සඳහා ද සහනාධාර රැසක් ක්‍රියාත්මක කරන ලදී.

පොල් අස්වැන්නේ තීරණාත්මක සාධකය වන ජල අවශ්‍යතාවය නිසා ඇතිවන බලපෑම අවම කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ලෙස ජලසම්පාදන සහනාධාර වැඩසටහන යටතේ ජල සම්පාදන ඒකක 419ක් අක්කර 5,739ක ඉදි කරන ලදී. එමෙන්ම පවතින පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීමේ හා පුරන් කුඹුරුවල පොල් වගාව තුළින් එම ඉඩම් ඵලදායී ඒකක බවට පත් කිරීමේ විශේෂ ව්‍යාපෘති 2021 වර්ෂයේදී ක්‍රියාත්මක විය.

පොල් වගාකිරීමේ මණ්ඩලය සතුව දිවයින පුරා, ක්‍රියාත්මක ශක්තිමත් ව්‍යාප්ති ජාලයක් පවතින අතර, එමගින් පොල් වගාකරුවන් සහ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන් හා විශ්ව විද්‍යාල සිසුන් සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මකකර ඇත. එසේම, කෘමි හානි මර්දන කටයුතු සඳහා අවශ්‍ය පෙරමෝන, විලෝපිත මයිටාවන් දිවයින පුරා හිඟයකින් තොරව ලබාදීමට හැකිවිය.

පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් හා පොල් උයන් සංවර්ධන අංශය මගින් තම දෛනික නිෂ්පාදනයන්ට අමතරව අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා දිරිගන්වමින් වැඩි ඵලදායීතාවයක් ලබා ගැනීමට මෙහෙයවීමට හැකිවිය. ඒ අනුව, තවාන් සංවර්ධන අංශය රු.මිලියන 26.924ක ලාභයක් ද ආදර්ශ පොල් උයන් මගින් රු.මිලියන 242.987ක ලාභයක් ද උපයා ගැනීමට හැකි විය.

වසර 49කට අධික කාලයක් පුරාවට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ලංකාවේ පොල් වගා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සිදුකරන ලද කාර්යයන් සාර්ථකකර ගැනීමට ගරු වැවිලි අමාත්‍යතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් හා මාර්ගෝපදේශකත්වය ඇතිව එම අමාත්‍යාංශ ලේකම්තුමන්ලා ඇතුළු කාර්යය මණ්ඩලය ලබා දුන් සහයෝගය පිළිබඳව කෘතවේදීව සිහිපත් කරමි. 2021 වර්ෂයේ කටයුතු සාර්ථකව නිමකිරීමට දායක වූ ගරු අධ්‍යක්ෂ මණ්ඩලයට හා ආයතනයේ කාර්යය මණ්ඩලයට ද මාගේ ස්තූතිය පුද කරමි.

ඒ.වී.කේ.මාධවී හේරත්

සභාපති

පොල් වගාකිරීමේ මණ්ඩලය

සාමාන්‍යාධිකාරිතුමියගේ පණිවිඩය



ආර්ථිකමය සහ සංස්කෘතිකමය වශයෙන් ශ්‍රී ලාංකික ජනතාවට අතිශයින් වැදගත් වන්නාවූ, වැවිලි බෝග කාණ්ඩය යටතේ වර්ගීකරණයකර ඇති ප්‍රධාන බෝගයක් ලෙස පොල් සැලකිය හැක. එබැවින් පොල් වගාව ප්‍රවර්ධනය සඳහා ස්ථාපිත රාජ්‍ය ආයතන ත්‍රිත්වය අතරින් පොල් වගාකිරීමේ මණ්ඩලය ජනතාවට ඉතා වැදගත්වූත් සමීපවූත් ආයතනයකි. ගෘහස්ථ පරිභෝජනය සහ අපනයන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන පොල් ගෙඩි ප්‍රමාණය ඉහළ නැංවීම අරමුණුකර ගනිමින්, නව පොල් වගාබිම් ප්‍රමාණය ඉහළ නැංවීමටත් පවතින පොල් වගාවේ පොල් ඵලදාව ඉහළ නැංවීමටත් ප්‍රමුඛතාවය ලබා දෙමින් 2021 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

පවතින පොල් වගාව නහාසිටුවීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රමුඛ කාර්යභාර්යක් වන බැවින් 2021 වර්ෂයේදී පොල් පැළ මිලියන 1.815ක් විවිධ සහනාධාර වැඩසටහන් හරහා ක්ෂේත්‍රයේ සිටුවීමට හැකි විය. එමගින් දිවයිනේ පොල් වගාබිම් ප්‍රමාණයට තවත් පොල් වගාබිම් අක්කර 28,000කට ආසන්න ප්‍රමාණයක් එකතු කිරීමට හැකියාව ලැබුණි. එසේම මෙතෙක් අඩුපාඩුවක්ව පැවති තැඹිලි බීජ උද්‍යානයක්ද පන්නල, කන්දෙටිය ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට හැකි විය.

එමෙන්ම පවතින පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා පොල් ඉඩම් පුනරුත්ථාපනය, සුහුරු ජල සම්පාදන පද්ධති ඉදිකිරීම හා පුරන් කුඹුරු වල පොල් වගාව (Sorjan) තුලින් එම ඉඩම් ඵලදායී වාණිජ ඒකක බවට පත්කිරීම වැනි විශේෂ ව්‍යාපෘති රැසක් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක විය. එමෙන්ම කප්රුක ආයෝජන ණය වැඩසටහන යටතේ වගාකරුවන් 451ක් වෙත ඉඩම් අක්කර 2,110ක් සංවර්ධනය සඳහා රු.මිලියන 210.48ක් ලබා දී ඇත.

ආයතනයේ පුරප්පාඩුව පැවති තනතුරු රාශියක් සඳහා නව බඳවා ගැනීම් සහ සේවක උසස්වීම් ලබාදීම් ද සිදු කරන ලදී. එමෙන්ම, පැවති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුව ද මණ්ඩලයේ හා වතු පාලන සේවාවේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට හැකිවිය. තව ද, සමස්ත කාර්ය මණ්ඩලය සඳහා බාහිර හා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් මගින් දැනුම, ආකල්ප, කුසලතා වර්ධනයටත් අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

මෙවැනි සුවිශේෂී වැඩසටහන් රාශියක් 2021 වර්ෂය තුළ පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමේදී එම කටයුතු සාර්ථකකර ගැනීම සඳහා ගරු වැවිලි අමාත්‍යතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අදාල අමාත්‍යාංශ වල ලේකම්වරුන් ඇතුළු කාර්ය මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් හා සහයෝගය පිළිබඳවත්, පොල් වගාකිරීමේ මණ්ඩලයේ පසුගිය වසරවල සේවය කළ සියලු සභාපතිවරු, වත්මන් සභාපතිතුමිය, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා ආයතනයේ කාර්ය මණ්ඩලයද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

කේ.එල්.මානෙල් කුලරත්න
සාමාන්‍යාධිකාරි
පොල් වගාකිරීමේ මණ්ඩලය

පොල් වගාකිරීමේ මණ්ඩලය ගැන සැකවින්

දිවයිනේ පොල් වගාව සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර වඩාත් විධිමත්ව හා ඵලදායිතාවයෙන් යුක්තව සාක්ෂාත්කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල 19ක්, පොල් සංවර්ධන නිලධාරී කාර්යාල 265ක්, පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන 03ක්, තවාන් 39ක්, ආදර්ශ පොල් උයන් 12ක් හා බීජ නිෂ්පාදන ඒකකයකින් පොල් වගාකිරීමේ මණ්ඩලය සමන්විතවේ.


ප්‍රධාන කාර්යාලය

"කප්රුක පියස"
9/428, පොල් වගාකිරීමේ මණ්ඩලය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
දුරකථන 011-2861331, 0115635623
ෆැක්ස්- 011-5549507
විද්‍යුත් තැපෑල - ccb@sltnet.lk
වෙබ් අඩවිය - www.coconut.gov.lk


අනුමත ස්ථීර කාර්ය මණ්ඩලය 918කි

සාමාන්‍යාධිකාරී	01
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	04
සහකාර සාමාන්‍යාධිකාරී	08
ප්‍රාදේශීය කළමනාකරුවන් හා විෂය භාර කළමනාකරුවන්	
විෂය භාර කළමනාකරුවන්	36
කණිෂ්ඨ කළමනාකරුවන්	95
භාෂා පරිවර්ථකයින්	02
කළමනාකරණ සහකාර (තාක්ෂණික)	
- පොල් සංවර්ධන නිලධාරීන්	300
- නේවාසික තවාන් භාර නිලධාරී	40
- තාක්ෂණික සහකාර	03
- පුහුණු නිලධාරී	01
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	
- පොල් සංවර්ධන සහකාර	76
- කළමනාකරණ සහකාර	200
ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්	152
සමස්ත කාර්ය මණ්ඩල ශක්තිය	918 කි

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආයතනික ව්‍යුහය



පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය



පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

ප්‍රාදේශීය කාර්යාල 19ක්			
අනු අං.	ප්‍රාදේශීය කාර්යාල	ලිපිනය	දුරකථන අංකය
01	අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල	තුන්වන පියවර, දහයියාගම හන්දිය, අනුරාධපුර.	025-2222543
02	අම්පාර ප්‍රාදේශීය කාර්යාල	ධර්මපාල මාවත, කච්චේරිය ඉදිරිපිට, අම්පාර	063-2222477
03	කළුතර ප්‍රාදේශීය කාර්යාල	නාගොඩ, කළුතර	034-2222732
04	කෑගල්ල ප්‍රාදේශීය කාර්යාල	වරකාඋල්ල වලව්ව, කරඹුපන, නුවරපාර, කෑගල්ල	035-2222120
05	කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල	වැහැර, කුරුණෑගල	037-2222534
06	කුලියාපිටිය ප්‍රාදේශීය කාර්යාල	අංක 20, පන්නල පාර, කුලියාපිටිය	037-2281169
07	ගම්පහ ප්‍රාදේශීය කාර්යාල	බැන්ඩියමුල්ල, ගම්පහ	033-2222037
08	ගාල්ල ප්‍රාදේශීය කාර්යාල	ලබුදුව, අක්මීමන, ගාල්ල	091-2234501
09	ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාල	කුඹුරුප්පිඩි, ත්‍රිකුණාමලය	026-2054018
10	පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාල	නව නගරය, පොළොන්නරුව	027-2222377
11	මඩකලපුව ප්‍රාදේශීය කාර්යාල	මයිලම්බවැලි, තන්නමුනෙයි, මඩකලපුව	065-2240103
12	මාතර ප්‍රාදේශීය කාර්යාල	අංක 331/9, අනගාරික ධර්මපාල මාවත, නූපේ, මාතර.	041-2222060
13	මාතලේ ප්‍රාදේශීය කාර්යාල	නුවර පාර, කොහොඹිලිවල, මාතලේ	066-2222047
14	මාරවිල ප්‍රාදේශීය කාර්යාල	මුදුකටුව, මාරවිල	032-2254237
15	මොණරාගල ප්‍රාදේශීය කාර්යාල	හුලංදාව දකුණ, මොණරාගල	055-2276058
16	යාපනය ප්‍රාදේශීය කාර්යාල	අංක 595/10, නාවලර් පාර, නල්ලූර්, යාපනය	021-2284501
17	රත්නපුර ප්‍රාදේශීය කාර්යාල	නව නගරය, රත්නපුර	045-2228561
18	හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාල	අංක 27, තංගල්ල පාර, හම්බන්තොට	047-2220144
19	වව්නියාව ප්‍රාදේශීය කාර්යාල	අංක 25, පත්තිනියාර්, මහිලන්කුලම්, තාන්ඩිකුලම්, වව්නියාව	024-2050344

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

පොල් වගාකිරීමේ මණ්ඩලය සතු බීජ පොල් පැළ තවාන් 39ක්			
අනු අං.	ප්‍රාදේශීය කාර්යාලය	ලිපිනය	දුරකථන අංකය
01	අනුරාධපුර	1. කලාවැව පොල් පැළ තවාන, කලාවැව විජිතපුර.	025-2264194
02	අම්පාර	2. උහන පොල් පැළ තවාන, පාලම්කඳවුර, උහන.	063-2250119
03	කළුතර	3. කොරොස්දූව පොල් පැළ තවාන, කොරොස්දූව, වාද්දූව	038-2295126
04	කෑගල්ල	4. මත්තමගොඩ පොල් පැළ තවාන, මත්තමගොඩ, කන්නත්තොට.	035-2289105
		5. එරමිණිගොල්ල පොල් පැළ තවාන, එරමිණිගොල්ල , හිරිවඩුන්න.	035-2263006
05	කුරුණෑගල	6. ඉබ්බාගමුව පොල් පැළ තවාන, ඉබ්බාගමුව.	037-2235776
		7. වාරියපොල පොල් පැළ තවාන, වාරියපොල.	037-2267691
		8. නිකවැරටිය පොල් පැළ තවාන, නිකවැරටිය.	037-2260619
		9. පොල්ගහවෙල පොල් පැළ තවාන, සෙරපීස්වත්ත, පනලිය, පොල්ගහවෙල.	037-2244367
		10. වෙන්නොරුව පොල් පැළ තවාන, මුතුගල වත්ත, වෙන්නොරුව.	037-2249836
		11. දොඩන්ගස්ලන්ද පොල් පැළ තවාන, බලවත්තල වත්ත, දොඩන්ගස්ලන්ද.	037-2252625
06	කුලියාපිටිය	12. බිංගිරිය පොල් පැළ තවාන, ප්‍රසන්න ගම, බිංගිරිය.	032-2246425
		13. කන්දෙටිය පොල් පැළ තවාන, කන්දෙටිය, මාකදුර, ගෝනවිල.	031-2299386
		14. හෙට්ටිපොල පොල් පැළ තවාන, හෙට්ටිපොල.	037-2291332
		15. දියදොර පොල් පැළ තවාන, පහල දියදොර.	037-2282537
		16. මහයාය පොල් පැළ තවාන, මහයාය.	031-2299938
07	ගම්පහ	17. වල්පිට පොල් පැළ තවාන, වල්පිට.	033-2272559
		18. කිරිදිවැල පොල් පැළ තවාන, කිරිදිවැල.	033-2267704
08	ගාල්ල	19. බද්දේගම පොල් පැළ තවාන, පෙඩරුස්වත්ත, හල්පාතොට, බද්දේගම, ගාල්ල.	091-2292745
		20. ලබුදූව පොල් පැළ තවාන, අක්මීමන, ගාල්ල.	091-2234501
09	ත්‍රිකුණාමලය	21. කුඹුරුපිඩිඩි පොල් පැළ තවාන, කුඹුරුපිඩිඩි, ත්‍රිකුණාමලය.	026-2054018
		22. සේරුවිල පොල් පැළ තවාන, සේරුවිල.	026-2054018
10	පොලොන්නරුව	23. පරාක්‍රම සමුද්‍රය පොල් පැළ තවාන, රිවඩි අළුවිහාරේ උද්‍යානය, පරාක්‍රම සමුද්‍රය.	027-2224304
		24. උල්හිටිය පොල් පැළ තවාන, උල්හිටිය වත්ත, ගිරාදුරුකෝට්ටේ.	027-2222377
11	මඩකලපුව	25. මයිලම්බවේලි පොල් පැළ තවාන, මයිලම්බවේලි, තන්නමුනෙයි, මඩකලපුව.	065-2240924
12	මාතලේ	26. පල්ලේකැලේ පොල් පැළ තවාන, පල්ලේකැලේ, බලගොල්ල, කෙන්ගල්ල.	081-2063595
13	මාරවිල	27. කිරිමැටියාන පොල් පැළ තවාන, කිරිමැටියාන, ලුණුවිල.	032-2254237
		28. විල්පොත පොල් පැළ තවාන, විල්පොත, බත්තුළුඔය.	032-2254237
		29. අට්ටවිල්ලුව පොල් පැළ තවාන, අට්ටවිල්ලුව, කුරුණෑගල පාර, පුත්තලම.	032-2254237
14	මොණරාගල	30. හඳපානාගල පොල් පැළ තවාන, හඳපානාගල වෙහෙරයාය.	055-2274665
		31. වැලිපිටිය පොල් පැළ තවාන, වැලිපිටියවත්ත, නන්පුරාව, බිබිල.	055-2276058

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

15	වව්නියා	32. මඩු පොල් පැළ තවාන, මන්නාරම.	024-2050344
16	යාපනය	33. කිලිනොච්චි පොල් පැළ තවාන, ඒ 3, පන්නන්කන්නි, කිලිනොච්චි.	021-2284501
		34. දේවිපුරම් පොල් පැළ තවාන, අංක 29/A කොටස, දේවිපුරම් පුදුකුඩිරිප්පු, මුලතිව්.	021-2284501
		35. අච්චුවේලි පොල් පැළ තවාන, වාසවිලාන් පාර, අච්චුවේලි, යාපනය.	021-2284501
		36. අලම්පිල් පොල් පැළ තවාන, අලම්පිල්, මුලතිව්.	021-2284501
17	රත්නපුර	37. ඇඹිලිපිටිය පොල් පැළ තවාන, තුංකම, ඇඹිලිපිටිය.	047-2230569
18	හම්බන්තොට	38. මැදමුලන පොල් පැළ තවාන, මැදමුලන, වීරකැටිය.	047-2246359
		39. මයුරපුර පොල් පැළ තවාන, මයුරපුර, හම්බන්තොට.	047-2220144

ආදර්ශ බීජ පොල් උයන් 12ක්		
අනු අං.	ලිපිනය	දුරකථන අංකය
01	මහයාය ආදර්ශ පොල් උයන, මාකඳුර, ගෝනවිල.	031-2299781
02	ලේනව ආදර්ශ පොල් උයන, හිරියාල, ලේනව.	037-4944425
03	ඩෙසිවැලි ආදර්ශ පොල් උයන, ඉලුක්වෙල, වැඋඩ	037-2299880
04	රන්දෙණිය ආදර්ශ පොල් උයන, වාරියපොල.	037-5555217
05	නාගන්සෝල ආදර්ශ පොල් උයන, වන්නි, රස්නායකපුර.	037-4944464
06	බෝපිටිය ආදර්ශ පොල් උයන, බෝපිටිය.(වයඹ)	037-2288601
07	ගර්ට්ලන්ඩ් ආදර්ශ පොල් උයන, නාඹිරිත්තන්කඩවර, වැලිපැන්නගහමුල.	037-4930928
08	කොහොඹාන ආදර්ශ පොල් උයන, කොහොඹාන වත්ත, ගොනාගොල්ල.	063-3632186
09	කොරෙයි ආදර්ශ පොල් උයන, තිරුක්කෝවිල්.	067-3694530
10	මුන්දලම ආදර්ශ පොල් උයන, මුන්දලම.	032-2052355
11	පාසිකුඩා ආදර්ශ පොල් උයන, කල්කුඩා, පාසිකුඩා.	065-2050224
12	පලෙයි ආදර්ශ පොල් උයන, නුවර පාර, පලෙයි.	021-2050013

පොල් වගාකිරීමේ මණ්ඩලය සතු පුහුණු මධ්‍යස්ථාන 03ක්			
අනු අං	පුහුණු මධ්‍යස්ථානය	ලිපිනය	දුරකථන අංකය
01	ලුණුවිල පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය	සහකාර සාමාන්‍යාධිකාරී (පුහුණු) පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, පොල් වගාකිරීමේ මණ්ඩලය ,බණ්ඩිරිප්පු වත්ත, ලුණුවිල.	031-2255048
02	මැදමුලන දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය	ස්ථාන භාර නිලධාරි, දක්ෂිණ ලංකා පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය, මැදමුලන, වීරකැටිය.	047-2257534
03	යාපනය පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය	ස්ථානභාර නිලධාරි, පොල් පැළ තවාන, අරලි පාර, අච්චුවේලි, යාපනය	021-3141245

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

බීජ නිෂ්පාදන ඒකකය			
01	බීජ නිෂ්පාදන ඒකකය	අංක 19, තම්මිට පාර, මීගමුව	031-2226119

පොල් තාක්ෂණික උද්‍යානය			
01	පොල් සංස්කෘතික උද්‍යානය	පොල් තාක්ෂණික උද්‍යානය පාසිකුඩා ආදර්ශ පොල් උයන, කල්කුඩා	065-2050224

පොල් වගාකිරීමේ මණ්ඩලය සතු සංචාරක නිවාස **09**ක්			
අනු අංකය	සංචාරක නිවාසය	ලිපිනය	දුරකථන අංකය
01	කතරගම	“කොකෝවිලා සංචාරක නිවාසය”, සංචාරක නිවාස පෙදෙස, ඩිපෝ පාර, කතරගම.	0472236344
02	පාසිකුඩා	පාසිකුඩා ආදර්ශ පොල් උයන, පොල් වගාකිරීමේ මණ්ඩලය, පාසිකුඩා , කල්කුඩා.	0652050224
03	පලෙයි	පලෙයි ආදර්ශ පොල් උයන, පොල් වගාකිරීමේ මණ්ඩලය, A9 පාර, පලෙයි.	0212050013
04	පොළොන්නරුව	“පුලතිසි කොකෝවිලා සංචාරක නිවාසය”, පොල් වගාකිරීමේ මණ්ඩලය, කලහගල පාර, නව නගරය, පොළොන්නරුව.	0272052881
05	නිලාවේලි	“කොකෝවිලා සංචාරක නිවාසය”, නිලාවේලි, කුඹුරුප්පිඩ්ඩි, ත්‍රිකුණාමලය.	0262054019
06	කොහොඹාන	කොහොඹාන ආදර්ශ පොල් උයන, පොල් වගාකිරීමේ මණ්ඩලය, ගොනාගොල්ල, අම්පාර.	063222477
07	හඳපානාගල	“හඳපානාගල සංචාරක නිවාසය”, හඳපානාගල පොල් පැළ තවාන, හඳපානාගල, වෙහෙරයාය.	0552274665
08	කටුකැලියාව	“කොකෝවිලා සංචාරක නිවාසය”, මහිලා මාවත, කටුකැලියාව, ගල්කඩවල.	0252222543
09	පොළොන්නරුව	“බෝපිටිය සංචාරක නිල නිවාසය”, බෝපිටිය ආදර්ශ පොල් උයන, කු/බෝපිටිය(වයඹ).	0372288601

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති හා සේවා ජාලය

"කප්තුරුපාය" වෙලෙඳසැල් හා සේවා මධ්‍යස්ථාන 05ක්		
අනු අං.	ලිපිනය	දුරකථන අංකය
01	මහයාය ආදර්ශ පොල් උයන, මාකඳුර, ගෝනවිල	031-2299781
02	බෝපිටිය ආදර්ශ පොල් උයන, බෝපිටිය (වයඹ)	037-2288601
03	පොල් වගාකිරීමේ මණ්ඩලය, "කප්රුක පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල	011-2861331
04	ඩේසිවැලි ආදර්ශ පොල් උයන, ඉලුක්වේල, වැලිඩ	037-2299880
05	අම්පාර ප්‍රාදේශීය කර්යාලය, ධර්මපාල මාවත, කච්චේරිය ඉදිරිපිට, අම්පාර	063-2222477

ඇතුලත පිටු

01.	ව්‍යාප්ති හා සංවර්ධන අංශය	01
02.	ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය	20
03.	පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය	40
04.	අභ්‍යන්තර විගණන අංශය	43
05.	මූල්‍ය කළමනාකරණ අංශය	45
06.	විගණකාධිපතිගේ වාර්තාව	51

1.0 <u>ව්‍යාප්ති හා සංවර්ධන අංශය</u>

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දේශීය පරිභෝජන ඉල්ලුම සහ අපනයන අවශ්‍යතාවය සපුරාලමින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත්කරලීමේ භාරදූර වගකීම ප්‍රධාන වශයෙන් පැවරී ඇත්තේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති සහ සංවර්ධන අංශය වෙත වේ. මෙම ක්‍රියාවලිය වඩාත් විධිමත්ව සහ ඵලදායීතාවයෙන් යුක්තව සපුරා ගැනීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති සහ සංවර්ධන)ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල 19ක් පවතී. මෙම ප්‍රාදේශීය කාර්යාලයන්ට අනුයුක්ත පොල් සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත 225කට ආසන්න ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් මගින් සුළු, මධ්‍යම සහ මහා පරිමාණ වශයෙන් පොල් වගාවේ නියැලී සිටින වගාකරුවන් වෙත අවශ්‍ය තාක්ෂණික උපදෙස් සහ යෙදවුම් ලබාදීම සිදු කරයි.

වාර්ෂිකව පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත භාණ්ඩාගාරයෙන් වෙන්කෙරෙන ප්‍රතිපාදන අනුව සහ වැවිලි අමාත්‍යාංශයේ සහ පොල්, කිතුල්, තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මගපෙන්වීම මත වාර්ෂික සංවර්ධන වැඩසටහන් සැලසුම් කරනු ලබන අතර ඒ අනුව 2021 වර්ෂයේදී පහත සඳහන් සහනාධාර සහ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

1.1. පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්

1.1.1 <u>ක්‍රමවත් පොල් වගාව යටතේ පැළ සිටුවීම</u>

මෙම සහනාධාරය යටතේ පොල් වගාකරුවන්ට නව වගාවක්, යටි වගාවක් හෝ නැවත වගාවක් ඇති කිරීම සඳහා නොමිලේ පොල් පැළ ලබාදෙන අතර අවම අක්කර ¼ සිට උපරිම අක්කර 15 දක්වා වගාකිරීමට පොල් පැළ ලබාදේ. එසේම මෙම පැළ වගාකරු වෙත ප්‍රවාහනය කරදෙනු ලබන අතර පැළ නිකුත් කිරීමට පෙර පැළ සිටුවීම හා නඩත්තුව පිළිබඳ තාක්ෂණික උපදෙස් පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ලබා දේ. 2021 වර්ෂයේදී මෙම වැඩසටහන මගින් පොල් පැළ 745,000ක් සිටුවීමට ඉලක්ක කරන ලද අතර වර්ෂය අවසන් වන විට පැළ 852,556ක් සිටුවීමට පොල් වගාකිරීමේ මණ්ඩලය සමත් විය. මීට අමතරව තැඹිලි වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ තැඹිලි පැළ 13,691ක් බෙදා දී ඇත. (2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය සමග නිවසේ සිට කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට ජනතාවට සිදුවීම තුළ පොල් වගාව සඳහා ද වැඩි නැඹුරුතාවයක් දැක්වීම නිසා මෙම වැඩසටහනට අදාලව ඉලක්කය ඉක්මවූ ප්‍රගතියක් අත්කරගෙන ඇත.)

වගු අංක 1.1 2021 වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ක්‍රමවත් පොල් පැළ සිටුවීමේ භෞතික ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	භෞතික ඉලක්කය (පැළ)	භෞතික ප්‍රගතිය (පැළ)
මොණරාගල	34000	40402
මාතර	4000	4296
කුරුණෑගල	136000	159183

කුලියාපිටිය	90000	100650
කෑගල්ල	25000	25746
ගම්පහ	51000	47890
කළුතර	20000	17387
මාරවිල	95000	116997
රත්නපුර	24000	24373
හම්බන්තොට	60000	60000
අනුරාධපුරය	32000	38832
ත්‍රිකුණාමලය	21000	28880
පොළොන්නරුව	17800	18324
අම්පාර	20000	28649
මාතලේ	19500	21260
ගාල්ල	20000	24230
මඩකලපුව	20000	20251
යාපනය	35700	54724
වව්නියාව	20000	20482
එකතුව	**745000**	**852556**

1.1.2. <u>ගෙවතු වගා වැඩසටහන</u>

ශ්‍රී ලාංකිකයන්ගේ දෛනික පොල් පරිභෝජන අවශ්‍යතාවය තම ගෙවත්තෙන්ම නිෂ්පාදනය කිරීමට ගෙවතු හිමියන් යොමු කිරීම ප්‍රධාන අරමුණ කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙම සහනාධාර වැඩසටහන ක්‍රමවේද කිහිපයක් මගින් ගෙවතු හිමියන්ට පොල් පැළ ලබාදීම සිදු කරනු ලැබේ. මේ යටතේ පොල් පැළ 126,923ක් සහනාධාර ලෙස වගාකරුවන් වෙත ලබා දී ඇත. (2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වය සමග නිවසේ සිට කෘෂිකාර්මික කටයුතුවල යෙදීමට ජනතාවට සිදුවීම තුළ පොල් වගාව සඳහා ද වැඩි නැඹුරුතාවයක් දැක්වීම නිසා මෙම වැඩසටහනට අදාළව ඉලක්කය ඉක්මවූ ප්‍රගතියක් අත්කරගෙන ඇත.)

වගු අංක 1.2: 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ගෙවතු වගා වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	**භෞතික ඉලක්කය (පැළ)**	**භෞතික ප්‍රගතිය (පැළ)**
මොණරාගල	18,100	11,878
මාතර	600	1,155
කුරුණෑගල	1,600	1,571
කුලියාපිටිය	7,700	12,223
කෑගල්ල	4,300	7,113
ගම්පහ	2,700	15,298
කළුතර	1,600	3,367

මාරවිල	3,800	3,696
රත්නපුර	2,500	6,006
හම්බන්තොට	1,300	3,705
අනුරාධපුරය	11,500	17,522
ත්‍රිකුණාමලය	5,900	4,744
පොළොන්නරුව	6,900	6,123
අම්පාර	2,300	5,923
මාතලේ	4,900	5,527
ගාල්ල	12,400	14,088
මඩකලපුව	1,000	912
යාපනය	9,100	2,572
වව්නියාව	1,800	3,500
එකතුව	**100,000**	**126,923**

2021 වර්ෂයේදී විශේෂ ගෙවතු වගා වැඩසටහන් යටතේ පොල් පැළ 638,835ක් වගාකරුවාට ලබාදෙන ලදී. මෙම පැළ ප්‍රමාණය පහත ක්‍රමවේද යටතේ සිටුවීම සිදු කරන ලදී. මීට අමතරව මුදලට පොල් පැළ 479,031 ක් වගාකරුවන් වෙත ලබාදෙන ලදී.

1. ජාත්‍යන්තර පොල් දිනය හා සමගාමීව ක්‍රියාත්මක කරන ලද ගෙවතු වගා වැඩසටහන
2. දොරින් දොරට කප්රුක ගෙවතු වගා වැඩසටහන
3. සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන
4. විශේෂ ගෙවතු වගා වැඩසටහන

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය යටතේ විශේෂ ගෙවතු වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක 1. 3 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් දොරින් දොරට කප්රුක ගෙවතු වගා වැඩසටහන භෞතික ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	**භෞතික ප්‍රගතිය (පැළ)**
මොණරාගල	26,508
මාතර	24,200
කුරුණෑගල	43,157
කුලියාපිටිය	27,513
කෑගල්ල	30,200
ගම්පහ	61,500
කළුතර	76,150
මාරවිල	33,338
රත්නපුර	31,800
හම්බන්තොට	10,600

අනුරාධපුරය	39,000
ත්‍රිකුණාමලය	14,100
පොළොන්නරුව	16,000
අම්පාර	34,209
මාතලේ	55,200
ගාල්ල	29,745
මඩකලපුව	9,515
යාපනය	65,100
වව්නියාව	11,000
එකතුව	**638,835**

1.1.3. <u>පාළු පැළ සිටුවීම මගින් පොල් ඉඩමක පැවතිය යුතු ප්‍රශස්ථ පොල් ගස් සංඛ්‍යාව නඩත්තු කිරීම</u>

අක්කරයක නඩත්තු කළයුතු ප්‍රශස්ථ පොල් ගස් ගණන නොපැවතීම ශ්‍රී ලංකාවේ පොල් වගාවේ ඉඩම්වල පොල් ඵලදායිතාව අඩුවීමට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත. 2021 වසරේදී පොල් ඉඩම් පුනරුත්ථාපනය යටතේ පාළු සිටුවීම සඳහා ඉලක්කගත පැළ ප්‍රමාණය 200,000 විය. 2021 වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන යටතේ පොල් පැළ 197,179ක් සිටුවන ලදී.

වගු අංක 1.4 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පාළු පැළ සිටුවීමේ ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පැළ)	ලබාදුන් පැළ ගණන
මොණරාගල	2730	1665
මාතර	993	825
කුරුණෑගල	49355	36292
කුලියාපිටිය	37220	41667
කෑගල්ල	9098	6707
ගම්පහ	33085	15874
කළුතර	4136	4408
මාරවිල	28950	39056
රත්නපුර	6617	3440
හම්බන්තොට	4136	14880
අනුරාධපුරය	3309	4644
ත්‍රිකුණාමලය	1489	3194
පොළොන්නරුව	4632	5705
අම්පාර	827	1705
මාතලේ	1654	2045
ගාල්ල	4657	2236
මඩකලපුව	1240	1297
යාපනය	4632	9997
වව්නියාව	1240	1542
එකතුව	**200,000**	**197,179**

ඉහත නව/නැවත/යටි වගා වැඩසටහන, ගෙවතු වගා වැඩසටහන, පාළු පැළ සිටුවීමේ වැඩසටහන යටතේ ලබා දුන් සියලුම පැළ රු.175/= ක වටිනාකමක් සහිත බිම් පැළයක් රු.75/= ට සහ රු.250/= ක වටිනාකමක් සහිත බඳුන් පැළයක් රු.150/= ට ලෙස සහනදායී මිලකට වගාකරුවෙකුහට ලබා දී ඇත. ඒ අනුව බිම් පොල් පැළයක හා බඳුන් පොල් පැළයක සහනාධාර වටිනාකම රු.100/= ක් විය. මීට අමතරව සෞභාග්‍යා ගෙවතු වගා වැඩසටහන යටතේ පොල් පැළ 327,003 වගාකරුවන් වෙත ගෙවතු පැළ ලෙස ලබා දෙන ලදී. මේ අනුව 2021 වර්ෂයේ සහනාධාර යටතේ ලබා දුන් මුළු පොල් පැළ සංඛ්‍යාව 1,815,493ක් විය. ඒ සඳහා රු.මි.174.05ක මුල්‍ය ප්‍රතිපාදන වැය කර ඇත.

1.1.4. <u>පෙර වසරවල සිටුවන ලද පොල් පැළ අධීක්ෂණය සඳහා සහනාධාර ලබා දීම</u>

නව/නැවත/යටි වගා සහනාධාර ක්‍රමය යටතේ 2018, 2019 සහ 2020 වර්ෂයේ වගා කරන ලද පොල් පැළ සඳහා නඩත්තු සහනාධාරයක් ලබාදීමට සැලසුම්කරන ලදී. එම පැළ නියමිත පරිදි ප්‍රශස්ථ තත්ත්වයෙන් වර්ධනය වී ඇති දැයි පසු විපරම් කිරීම තුළින් නව/නැවත/යටි වගා සහනාධාර වැඩසටහනෙහි ඵලදායිතාවය වැඩි කිරීම මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණයි.

මේ යටතේ 2021 වර්ෂයේදී පොල් පැළ 507,140ක් සඳහා රු.මි 34.35ක සහනාධාර ලබා දී ඇත. වගාකරුවන් 4,926කට සහනාධාර ලබා දී ඇත.

වගු අංක 1.5 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් පෙර වසරවල සිටුවන ලද පොල් පැළ අධීක්ෂණ සහනාධාර ලබා දීමේ ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පැළ)	ලබාදුන් පැළ ගණන
මොණරාගල	30,000	22,586
මාතර	12,000	6,615
කුරුණෑගල	105,000	52,702
කුලියාපිටිය	56,000	51,597
කෑගල්ල	18,000	15,064
ගම්පහ	60,000	45,263
කළුතර	40000	19,257
මාරවිල	30,000	39,957
රත්නපුර	23,000	7,677
හම්බන්තොට	30,000	27,701
අනුරාධපුරය	32,000	31,077
ත්‍රිකුණාමලය	20,000	19117
පොළොන්නරුව	16,000	13,027
අම්පාර	10,000	8,082
මාතලේ	27,000	27,041
ගාල්ල	11,000	10,999
මඩකලපුව	48,000	29,424
යාපනය	80,000	64,650
වව්නියාව	20,000	15,304
එකතුව	**668,000**	**507,140**

1.1.5. <u>අතුරු බෝග වගා සහනාධාර වැඩසටහන</u>

පොල් ඉඩමෙන් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම තුළින් පොල් වගාකරුවාගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම අරමුණ කර ගනිමින් පොල් වගාකළ ඉඩම් වල නිර්දේශිත අතුරු බෝග වගා කිරීම සඳහා අක්කරයකට රු 15,000ක් බැගින් සහනාධාර ලබා දීමට මෙමගින් සැලසුම් කරන ලදී.

මෙම වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී පොල් අක්කර 2,715ක අතුරු වගාව ස්ථාපිත කර සහනාධාර වශයෙන් රු.මි 37.86ක් ලබා දී ඇත. මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහත වගුවෙන් නිරූපණය වේ. වගාකරුවන් 1,802කට සහනාධාර ලබා දී ඇත.

වගු අංක 1.6 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් අතුරු බෝග වගා සහනාධාර වැඩසටහන යටතේ භෞතික ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (අක්කර)	භෞතික ප්‍රගතිය (අක්කර)
මොණරාගල	125	117
මාතර	160	121
කුරුණෑගල	345	346
කුලියාපිටිය	353	362
කෑගල්ල	40	40
ගම්පහ	340	341
කළුතර	125	152
මාරවිල	90	96
රත්නපුර	60	49
හම්බන්තොට	200	214
අනුරාධපුරය	110	116
ත්‍රිකුණාමලය	100	91
පොළොන්නරුව	70	66
අම්පාර	87	92
මාතලේ	83	88
ගාල්ල	115	116
මඩකලපුව	40	40
යාපනය	250	238
වව්නියාව	30	30
එකතුව	**2723**	**2715**

1.1.6. <u>වන සතුන්ගෙන් ආරක්ෂා කිරීමේ සහනාධාර වැඩසටහන</u>

පැළ වගාව වන සතුන්ගෙන් ආරක්ෂා කිරීමේ සහනාධාර වැඩසටහන පැළ වගාවට ඉත්තෑවන්, වල්ඌරන් වැනි ක්ෂීරපායී වන සතුන්ගෙන් පොල් පැළ වලට සිදුවන හානිය වළකාගැනීම සඳහා එම පැළවලට ආරක්ෂිත ක්‍රමවේද යෙදීම වෙනුවෙන් විශේෂ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහිදී සම්ප්‍රදායික ක්‍රමවේද වලට මෙන්ම විදුලි වැට වැනි නවීන ක්‍රමවේද යෙදීම වෙනුවෙන් ද සහනාධාර ලබාදෙන ලදී. එහිදී ආරක්ෂිත ක්‍රමවේද යොදනු ලබන පැළයකට රු.200ක සහනාධාර මුදලක් ලබාදෙන ලදී.

2021 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ පොල් පැළ 86,554කට ආරක්ෂිත ක්‍රමවේද යෙදීම වෙනුවෙන් රු.මිලියන 17.37 සහනාධාර ලෙස ගෙවීම සිදුකරන ලදී. වගාකරුවන් 787කට සහනාධාර ලබා දී ඇත.

වගු අංක 1.7 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් වන සතුන්ගෙන් ආරක්ෂා කිරීමේ සහනාධාර වැඩසටහන යටතේ ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පැළ)	ප්‍රගතිය (පැළ ගණන)
මොණරාගල	3,000	3,557
මාතර	1,900	1,056
කුරුණෑගල	18,000	16,849
කුලියාපිටිය	7,800	7,533
කෑගල්ල	9,200	7,692
ගම්පහ	4,300	4,457
කළුතර	1,900	1,886
මාරවිල	1,900	1,987
රත්නපුර	3,900	3,488
හම්බන්තොට	2,700	2,642
අනුරාධපුරය	5,500	6,097
ත්‍රිකුණාමලය	1,200	510
පොළොන්නරුව	3,693	3,695
අම්පාර	6,250	6,536
මාතලේ	9,800	9,796
ගාල්ල	2,500	2,507
මඩකලපුව	1,500	1,376
යාපනය	5,000	3,034
වව්නියාව	3,500	1,856
එකතුව	**93,543**	**86,554**

1.2. <u>විශේෂ ව්‍යාපෘති</u>

2021 වර්ෂයේදී අයවැය කතාව මගින් ජල සම්පාදන සහනාධාර, පොල් ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීමේ සහනාධාර සහ පුරන් කුඹුරුවල පොල් වගාකිරීමේ සහනාධාර සඳහා ප්‍රතිපාදන රු.මිලියන 648ක් වෙන් කරන ලදී. ඊට අමතරව පෙර වසරවල සිට ක්‍රියාත්මක කරන ලද විලෝපිත මයිටා පැකට් බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සහ වැලිගම රෝග මර්දන වැඩසටහන යන ව්‍යාපෘති 2කට රු.මිලියන 85.76ක් වෙන් කරන ලදී.

1.2.1. <u>පොල් ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන</u>

පොල් ඉඩම්වල හා පොල් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් කෙටි හා දිගු කාලීන වශයෙන් පොල් අස්වැන්න වැඩි කිරීමත් පොල් ගොවියාගේ ජීවන තත්වය උසස් කිරීමත් යන අරමුණ සපුරාගැනීම සඳහා ක්‍රමවේද කිහිපයක් යටතේ පොල් වගාකරුවාට සහනාධාර සැපයීම මෙම වැඩසටහන යටතේ සිදු කරනු ලබයි. ඒ අනුව පහත සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

<u>විවිධ පුනරුත්ථාපන ක්‍රම යටතේ පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම</u>

මෙම වැඩසටහන මගින් පොල් ඉඩමේ පහත ශෂ්‍ය විද්‍යාත්මක කටයුතු දියුණු කිරීම සඳහා වගාකරුවාට සහනාධාර ලබා දෙයි.

- පොල් ඉඩම්වල තෙතමන සංරක්ෂණය සඳහා ලෙලි වලවල් ඉදිකිරීම
- පාංශු සංරක්ෂණය සඳහා ගල් වැටි සහ සමෝච්ඡ කාණු ඉදිකිරීම
- පොල් වගාව සඳහා කාබනික පොහොර යෙදීම
- පොහොර කවය නඩත්තුව සහ වසුන් කිරීම
- පොල් ගසට ඩොලමයිට් යෙදීම

ඉහත ශෂ්‍ය විද්‍යාත්මක කටයුතු ඉටු කිරීම වෙනුවෙන් අක්කරයකට උපරිම රු.30,000 සහනාධාරක් වෙන් කරන ලදී. මෙම සහනාධාරය ඉටුකරන කාර්යයට පමණක් ගෙවීම සිදුකල හැකි සේ පැකේජයක් ක්‍රියාත්මක කරන ලදී. වගාකරුවන් 4,471කට සහනාධාර ලබා දී ඇත.

වගු අංක 1.8 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් විවිධ පුනරුත්ථාපන ක්‍රම යටතේ පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	මූල්‍ය ඉලක්කය (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)	භෞතික ප්‍රගතිය (අක්කර)
මොණරාගල	1.50	1.08	134
මාතර	1.57	1.49	217
කුරුණෑගල	19.41	15.54	1589
කුලියාපිටිය	16.29	16.03	2112
කෑගල්ල	1.50	1.50	114
ගම්පහ	9.90	9.89	1374
කළුතර	2.55	2.59	88
මාරවිල	6.00	6.00	748
රත්නපුර	1.30	1.43	179
හම්බන්තොට	4.37	3.83	457
අනුරාධපුරය	2.65	2.67	261
ත්‍රිකුණාමලය	4.08	3.11	305
පොළොන්නරුව	2.30	2.34	339
අම්පාර	3.21	3.21	120
මාතලේ	2.69	3.34	405
ගාල්ල	2.25	2.23	181

මඩකලපුව	1.35	1.35	181
යාපනය	16.50	16.52	1,546
වව්නියාව	0.60	0.99	42
එකතුව	**100.0**	**95.14**	**10,392**

1.2.2. පුරන් කුඹුරු වාණිජ ඒකක ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

පුරන් කුඹුරුවල පොල් වගාව තුළින් එම ඉඩම් ඵලදායී ඒකක බවට පත්කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. විශේෂයෙන් B හා C කාණ්ඩයට අයත් පුරන් කුඹුරුවල පොල් වගාව මෙමගින් ඉලක්ක කරන ලදී. ඒ අනුව පොල් වගාවට කැමැත්ත පළකරන ලද වගාකරුවන්ගේ පුරන් කුඹුර අක්කර 907ක් පොල් වගාකිරීමේ මණ්ඩලයේ තාක්ෂණික නිලධාරීන් විසින් පරීක්ෂාකර අදාළ ඉඩම්වල පොල් වගාව සඳහා අනුමැතිය ඉල්ලා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. එහෙත් පොල් වගාකිරීමේ මණ්ඩලයේ අපේක්ෂා කළ පරිදි එම ඉඩම් සඳහා අනුමැතිය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත නොහැකි විය. ඒ අනුව රජයට අයත් පුරන් කුඹුරුවල පොල් වගාකිරීමට තීරණයකරන ලද අතර ඒ යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ පුරන් කුඹුරු අක්කර 3.25ක පොල් වගාව සඳහා පියවර ගන්නා ලදී. ඒ සඳහා වන මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 3.5කි.

1.2.3. ජල සම්පාදන පද්ධති ඉදිකිරීමේ විශේෂ ව්‍යාපෘතිය

නියඟයෙන් පොල් ගස ආරක්ෂා කිරීමටත්, වැඩි පොල් ඵලදාවක් ලබා ගැනීමටත්, පොල් ගස සඳහා නිරන්තර ජල සැපයුමක් අවශ්‍ය වේ. ඒ අනුව අහිතකර දේශගුණික තත්ත්ව යටතේදී පොල් වගාව ආරක්ෂා කිරීම සඳහා පොල් ඉඩමේ ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීමට විශේෂ ව්‍යාපෘතියක් පොල් වගාකිරීමේ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ පොල් පර්යේෂණ ආයතනයේ අඩු වියදම් ජල සම්පාදන ක්‍රමය ලෙස නිර්දේශකරන ලද නල ජල සම්පාදන පද්ධති සඳහා සහනාධාර ලබාදෙනු ලැබීය.

ඒ අනුව ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති සහ සරල ජල සම්පාදනය පද්ධති අක්කර 4,226 ජල ප්‍රභව ඉදිකිරීම අක්කර 1,513 අවසන් කරමින් ඒකක 419 ස්ථාපිතකරන ලදී. 2021 වර්ෂයේ ඉහත ක්‍රමවේද යටතේ වගාකරුවන් 1,686කට සහනාධාර ලබා දී ඇත. මේ සඳහා රු.මි.229.97 මුල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

මෙම වැඩසටහනේ ප්‍රාදේශීය කාර්යාල අනුව ඉලක්ක හා ප්‍රගතිය පහත වගුවෙන් නිරූපණය වේ.

වගු අංක 1.9 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ජල සම්පාදන පද්ධති ඉදිකිරීමේ විශේෂ ව්‍යාපෘතියේ ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	මූල්‍ය ඉලක්කය (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (රු.මි)	භෞතික ප්‍රගතිය (අක්කර)
මොණරාගල	6.28	6.04	139
මාතර	0.94	0.94	37
කුරුණෑගල	43.06	43.80	1374
කුලියාපිටිය	24.69	24.80	805

කෑගල්ල	1.62	1.62	63
ගම්පහ	3.97	3.97	158
කළුතර	1.20	1.10	27
මාරවිල	35.29	36.02	1277
රත්නපුර	5.24	5.13	157
හම්බන්තොට	8.65	8.64	237
අනුරාධපුරය	8.01	8.00	200
ත්‍රිකුණාමලය	2.95	2.95	96
පොළොන්නරුව	8.56	8.58	204
අම්පාර	4.58	4.58	154
මාතලේ	5.96	6.00	94
ගාල්ල	3.59	3.59	112
මඩකලපුව	3.05	3.05	91
යාපනය	11.82	5.77	458
වව්නියාව	2.49	2.45	56
එකතුව	**181.95**	**177.04**	**5739**

මේ යටතේ පොල් ඉඩමේ ජල සම්පාදනය වෙනුවෙන් සහනාධාර ලබාදීම සහ අඩු පොළියක් යටතේ කප්රුක අයෝජන ණය යෝජනා ක්‍රමය මගින් ණය ලබාදීම සිදුකරන ලදී. සහනාධාර ලබාදීම ප්‍රධාන කාර්යයන් 3ක් ඉලක්කකර ගෙන ඉටුකරන ලදී.

1. පොල් ඉඩමේ ක්ෂේත්‍ර ජල සම්පාදන පද්ධති ඉදිකිරීම - අක්කරයකට උපරිම සහනාධාර රු.40,000
2. පොල් ඉඩමේ සරල ජල සම්පාදන පද්ධති ඉදිකිරීම - අක්කරයකට උපරිම සහනාධාර රු.15,000
3. පොල් ඉඩමේ ජල ප්‍රභව ඉදිකිරීම - අක්කරයකට උපරිම සහනාධාර රු.50,000

1.2.4. <u>විලෝපිත මයිටා පැකට් බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය</u>

පොල් මයිටා පාලන වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී සියලුම ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශ ආවරණය කරමින් විලෝපිත මයිටා පැකට් 246,386ක් බෙදා දෙන ලදී. මෙහිදී විලෝපිත මයිටා පරපෝෂී පැකට් සහනදායී මිලකට වගාකරුවන් හට ලබාගැනීමට අවස්ථාව උදාවිය.
ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්නට ප්‍රබල බලපෑමක් සිදුකරනු ලබන මයිටාවන් පාලනය කිරීමට, කේන්ද්‍ර ගතව නිෂ්පාදනය කළ පරපෝෂිතයන් බෙදාහැරීම සහ පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල ගබඩා පහසුකම් ඉදිකිරීමේ අරමුණින් 2021 වර්ෂයේදී විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මේ යටතේ 2021 වර්ෂයේදී පරපෝෂී ගබඩා 03ක්, විද්‍යාගාර 02, මයිටා පරපෝෂී පැකට් ප්‍රවාහනය සඳහා ලොරි රථයක් නවීකරණය කිරීම සහ විද්‍යාගාර සහ ගබඩා සඳහා උපකරණ මිලදීගැනීම සිදුකරන ලදී. එම වැඩසටහන් මූල්‍ය ප්‍රගතිය රු.මි.10.00කි.
මීට අමතරව ආදර්ශ පොල් උයන්වල මයිටා මර්දනය සඳහා මයිටා පරපෝෂී පැකට් 32,777ක් නිකුත්කර ඇත.

1.2.5. <u>වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහන</u>

ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයේ මාතර දිස්ත්‍රික්කයට අයත් වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් මුලින්ම වාර්තා වූ වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී තත්ත්වය පසු කාලීනව ගාල්ල හා

හම්බන්තොට දිස්ත්‍රික්කවලින් ද වාර්තා විය. වෛරසයකට බොහෝදුරට සමාන ෆයිටොප්ලාස්මා ව්‍යාධිකාරකය මගින් මෙම රෝගය ඇති කෙරෙන අතර දැනට ලෝකයේ කිසිදු රටක ෆයිටොප්ලාස්මා සඳහා නිසි ප්‍රතිකාරයක් සොයාගෙන නොමැත.

මෙම රෝගය හඳුනා ගැනීමෙන් පසුව පොල් පර්යේෂණ ආයතනය, ශාක ආරක්ෂක පනත ක්‍රියාත්මක කිරීමේ නෛතික බලධරයා වන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා සමග එක්ව මාතර, හම්බන්තොට හා ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවා කොට්ඨාස 408ක් රෝගී කලාප වශයෙන් නම් කර ඇත.

එසේම රෝගය පිටතට බෝවීම වැලැක්වීම සඳහා ගාල්ල දෙනියාය සිට හක්මන හරහා තංගල්ල දක්වා වන මාර්ගයක කී.මී. 86ක් දිග කී.මී. 3 පළල රෝග වැලක්වීමේ කලාපයක් නම්කරන ලදී. මෙම කලාපයේ සියලුම රෝගී ගස් ගලවා දමන අතර මෙම කලාපයේ මායිම් වලින් පිටට පොල් ගසේ හි කිසිදු ජීව ද්‍රව්‍යයක් ගෙනයාම ශාක ආරක්ෂක පනත යටතේ තහනම් කරන ලදී. එසේම කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මගින් මෙම කුලයට අයත් අනෙකුත් බෝගයන් ප්‍රවාහනය සඳහා ද මෙම තහනම පනවා ඇත.

මෙම රෝගය මර්දනය සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග නොමැති බැවින් පොල් පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි 2008 වසරේ සිට රෝගී පොල් ගස් ඉවත් කිරීම ආරම්භකරන ලදී.

2021 වසර තුළදී පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් ග්‍රාම නිලධාරී වසම් 151ක් පරීක්ෂා කර රෝගී ගස් 7,681ක් හඳුනාගෙන ඇත. එයින් රෝගී ගස් 4,761ක් මේ වන විට ඉවත් කර ඇත. රෝගී ගස් 571ක් එන්නත් කර ඇත. වන්දි වශයෙන් ගස් 9,773ක් සඳහා ලබා දී ඇති මුදල රු.මී. 18.20කි.

වගු අංක 1.10 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්ධන වැඩසටහනේ ප්‍රගතිය.

දිස්ත්‍රික්කය	පරීක්ෂා කළ ග්‍රාම නිලධාරී වසම් ගණන	සලකුණු කළ ගස් ගණන	ඉවත් කළ ගස් ගණන	එන්නත් කළ ගස් ගණන	ගෙවීම් කළ ගස් ගණන
මාතර	136	7254	4424	571	9447
ගාල්ල	4	107	200	0	200
හම්බන්තොට	11	320	137	0	126
එකතුව	**151**	**7681**	**4761**	**571**	**9773**

1.3 <u>ව්‍යාප්ති වැඩසටහන්</u>

කෘෂිකාර්මික සේවා සපයන ආයතනයක් වශයෙන් පොල් වගාකිරීමේ මණ්ඩලය ස්වකීය සේවාලාභියා මත පොල් වගාකරුවා වෙත පොල් වගාවට අදාළව ව්‍යාප්ති තොරතුරු ලබාදීම අනිවාර්යයෙන් කළ යුතුව ඇත. එය මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාර්යකි. මෙය සම්බන්ධීකරණය වී ඇත්තේ පහත ආකාරයටයි.

සමස්ත සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හා අදාළ සංවර්ධන සැලැසුම් මෙන්ම ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන වෙන්කිරීමේ සැලැස්ම ද සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති හා සංවර්ධන) විසින් සිදුකෙරෙන අතර එය ව්‍යාප්ති හා සංවර්ධන අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ එකඟතාවය හා අධීක්ෂණය යටතේ සිදුකෙරේ. ඊට අනුකූලව මෙම සියලු තොරතුරු ලිඛිතව හා චක්‍රලේඛන අනුසාරයෙන් ප්‍රාදේශීය කාර්යාල වෙත යැවෙන අතර ප්‍රාදේශීය කළමනාකරුවන් විසින් තම බල ප්‍රදේශය තුළ සංවර්ධන හා ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙහි අධීක්ෂණ නිලධාරීන් වශයෙන් ප්‍රාදේශීය කළමනාකරුට අමතරව සහකාර ප්‍රාදේශිය කළමනාකරුවන් හා

ගොවිපළ සැලසුම් නිලධාරින් ක්‍රියාකරනු ලැබේ. ඔවුන්ගේ පුර්ණ අධීක්ෂණය යටතේ වාර්ෂිකව හා මාසිකව පොල් සංවර්ධන නිලධාරින් හා ක්ෂේත්‍ර නිලධාරින්ගේ ව්‍යාප්ති කටයුතු සංවිධානය කෙරෙන අතර මේ සඳහා අවශ්‍ය පුර්ණ සහයෝගය, සම්පත් ලබාදීම හා මග පෙන්වීම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයෙහි විෂයානුබද්ධ නිලධාරීන් මගින් සිදුකෙරේ.

මේ හැරණු විට ප්‍රධාන කාර්යාලයේ ව්‍යාප්ති සහ සංවර්ධන අංශය සහ තොරතුරු ඒකකය ජාතික මට්ටමින් ව්‍යාප්ති සේවය ලබාදීම සිදු කරයි.

2021 වසරේදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන වශයෙන් පහත අරමුණු ඉලක්ක කර ගන්නා ලදී.

1. පොල් වගාවේ ඵලදායිතාවය වැඩි කිරීම
2. කෘමි හා පළිබෝධ මගින් පොල් වගාවේ සිදු වන හානිය අවම කිරීම
3. පොල් පැළ සිටුවීම සහ නඩත්තුව පිළිබඳ දැනුම වගාකරුවාට ලබාදීම
4. පොල් ඉඩමේ ජලය ආරක්ෂා කිරීම හා ජල සම්පාදන කටයුතු ස්ථාපිත කිරීම
5. පොල් ඉඩමේ අතුරු වගාව හා සත්ව පාලනය

2021 වසරේදී පොල් වගාකිරීමේ මණ්ඩලය කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් 650 දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව ඒක පුද්ගල හමුවීම් 74,369ක්ද සිදුකර ඇත. ඒ අනුව 2021 වර්ෂයේදී සමස්ත වගාකරුවන් හමුවීම් සංඛ්‍යාව 11,770කි. මෙම වැඩසටහන් මූල්‍ය ප්‍රගතිය රු.මි.19.25කි.

වගු අංක 1.11 : 2021 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ව්‍යාප්ති වැඩසටහන්වල ප්‍රගතිය.

ප්‍රාදේශීය කාර්යාලය	**ඒක පුද්ගල හමුවීම් ප්‍රගතිය**	**කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් ප්‍රගතිය**
මොණරාගල	2781	11
මාතර	7563	34
කුරුණෑගල	9288	56
කුලියාපිටිය	10034	46
කෑගල්ල	2896	65
ගම්පහ	6600	73
කළුතර	2481	12
මාරවිල	4853	28
රත්නපුර	363	26
හම්බන්තොට	5797	16
අනුරාධපුර	3368	31
ත්‍රිකුණාමලය	1975	32
පොළොන්නරුව	2177	7

අම්පාර	4983	49
මාතලේ	1740	37
ගාල්ල	3292	44
මඩකලපුව	1815	28
යාපනය	1036	41
වව්නියාව	1327	14
එකතුව	**74369**	**650**

1.4 "කප්රුක ආයෝජන" ණය යෝජනා ක්‍රමය

"කප්රුක ආයෝජන" ණය යෝජනා ක්‍රමය, 1998 වසරේ සිට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් දිවයිනේ ප්‍රමුඛතම මූල්‍ය ආයතන වල සහභාගීත්වය ඇතිව පොල් වගාකරුවන්ගේ ඉඩම් සංවර්ධනයට අවශ්‍ය මූල්‍යාධාර හා තාක්ෂණික මග පෙන්වීම් ලබාදීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන සහනදායී ණය ක්‍රමයකි.

ණය ක්‍රමය පොල් වගාකරුවන්ගේ ඉඩම්වල පූර්ණ සංවර්ධනය අපේක්ෂා කරන අතර, එමගින් වාණිජ කෘෂිකර්මය පොල් ඉඩම් ආශ්‍රිතව ප්‍රවර්ධනය කිරීමත්, රටේ සංවර්ධනයට පොල් වගා ක්ෂේත්‍රයේ දායකත්වය වැඩි කිරීමත්, ක්ෂේත්‍රයේ පොල් වගාකරුවන්ගේ හා රැකියා නියුක්තිකයන්ගේ ආදායම් තත්වය ඉහළ නැංවීමත්, මූලික පරමාර්ථ කොටගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ණය ක්‍රමය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය සමග මහජන බැංකුව හා ලංකා බැංකුව යන රාජ්‍ය වාණිජ බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සණස සංවර්ධන බැංකුව හා ජාතික සංවර්ධන බැංකුව යන සංවර්ධන බැංකු හා හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව හා යූනියන් බැංකුව යන පෞද්ගලික වාණිජ බැංකු ගිවිසුම් ගත පාර්ශවකරුවන් ලෙස ණය මූල්‍යාධාර ලබාදීමේ කටයුතු සඳහා දායක වේ.

මෙමගින් පොල් ඉඩම් සංවර්ධනය ආශ්‍රිතව නව වගාව, නැවත වගාව, ඉඩම් පුනරුත්ථාපනය, අතුරුබෝග වගාව, සත්ත්ව පාලනය, ජල සම්පාදන පද්ධති පිහිටුවීම, කෘෂි යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා අතුරු වගා තවාන් පිහිටුවීම යන සංවර්ධන කාර්යයන් සඳහා සහනදායී පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් ලබාදෙනු ඇත.

මේ තුළින් 8%ක පොලී අනුපාතය යටතේ ණය මූල්‍යාධාර ලබාදෙන අතර, සාර්ථකව සංවර්ධන කටයුතු සිදුකරන වගාකරුවන් වෙත පළමු වසරේ සිට පස්වන වසර දක්වා 100%, 50% වශයෙන් පොලී සහන ප්‍රතිදාන ලබාදේ. එමගින් සළුල පොලී අනුපාතය 3.7%ක් වැනි අඩු පොලී අනුපාතයකට මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ ඉඩප්‍රස්ථාව සාර්ථක වගාකරුවන් වෙත සලසා ඇත.

මෙම ණය මූල්‍යාධාර හා ඒකාබද්ධව නොමිලේ තාක්ෂණික උපදේශන සේවා සහ ණය ව්‍යාපෘති සකසා දීම සිදු කෙරෙන අතර, එමගින් වගාකරුවන්ට සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය අමතර සේවා සැලසීම ද සිදු වේ.

2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය අනුව, වගාකරුවන් 451ක් වෙත ඉඩම් අක්කර 2,110ක් සංවර්ධනය සඳහා රු.මිලියන 210.48ක් ලබා දී ඇත. ඒ සඳහා මෙම වසර තුළදී රුපියල් මිලියන 144.55ක ප්‍රතිමූල්‍ය පහසුකම් අදාළ මූල්‍යායතන වෙත ලබා දී ඇති අතර, වගාකරුවන් සඳහා රුපියල් මිලියන 12.98ක පොලී සහන ප්‍රතිදාන ගෙවීම් සිදුකර ඇත. මේ අනුව ඉලක්ක හා සාපේක්ෂව සමස්ත ප්‍රගතිය 80% පමණ වී ඇත.

වගු අංක **1.12 2021** වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් ප්‍රගතිය

ප්‍රාදේශීය කාර්යාලය	**ඉලක්කය (අක්කර)**	**ප්‍රගතිය (අක්කර)**
මොණරාගල	90	25
මාතර	76	79
කුරුණෑගල	360	257
කුලියාපිටිය	350	359
කෑගල්ල	50	31
ගම්පහ	255	222
කළුතර	81	83
මාරවිල	323	325
රත්නපුර	90	77
හම්බන්තොට	135	98.4
අනුරාධපුරය	105	110
ත්‍රිකුණාමලය	65	10
පොළොන්නරුව	30	18.5
අම්පාර	110	63
මාතලේ	100	72
ගාල්ල	95	69
මඩකලපුව	95	67
යාපනය	175	124.5
වව්නියාව	65	20
එකතුව	**2650**	**2110**

වගු අංක 1.13. 2021 වර්ෂයේදී ප්‍රතිමූල්‍ය පහසුකම් මූල්‍ය ආයතන වෙත ලබාදීමේ ප්‍රගතිය

බැංකුව	ප්‍රතිමූල්‍ය වටිනාකම(.රු)
ලංකා බැංකුව	45,314,650.00
මහජන බැංකුව	19,805,100.00
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	46,870,000.00
කොමර්ෂල් බැංකුව	16,549,500.00
සම්පත් බැංකුව	4,140,000.00
සෙලාන් බැංකුව	1,448,000.00
හැටන් නැෂනල් බැංකුව	4,841,250.00
යූනියන් බැංකුව	-
සණස සංවර්ධන බැංකුව	5,587,000.00
එකතුව	144,555,500.00

‘‘කප්රුක ආයෝජන’’ ණය ක්‍රමය පොල් වගාකරුවන් අතර හා විවිධ අධිකාරීන් අතර ඉහළ පිළිගැනීමකට ලක් වී ඇති අතර, ඒ තුළ වැඩිවෙමින් පවතින ණය ඉල්ලුම සපුරාගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමත්, වැඩිවන සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත්ව ලබා ගැනීමත්, ඒ තුළින් වගාකරුවන්ගේ අපේක්ෂිත සේවාවන් ප්‍රශස්ත මට්ටමින් ලබාදීමත් ඉදිරි සංවර්ධන අරමුණු අතර වේ.

1.5 ජාතික පුහුණු වැඩසටහන්

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ත ජාතික ව්‍යාප්ති වැඩසටහන යටතේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හරහා ව්‍යාප්ති හා පුහුණු වැඩසටහන් සිදුකෙරේ. පුහුණු වැඩසටහන් යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ නිලධාරීන්, පොල් වගාකරුවන් හා කෘෂිකර්මය හදාරන සිසුන් පුහුණු කිරීම සිදු කරයි.
2021 වර්ෂයේ පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රධාන අංශ 3ක් යටතේ පහත දැක්වෙන අයුරින් පුහුණු වැඩසටහන් පවත්වා ඇත. 2021 වසරේ රට තුළ බලපෑ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මාර්ගස්ථ ක්‍රමයට බොහෝ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

වගු අංක 1.14 : 2021 වර්ෂයේදී මාර්ගස්ථ ක්‍රමයට පවත්වන ලද පුහුණු වැඩසටහන්.

පුහුණු වැඩසටහන	ඇස්තමේන්තු ගත		ප්‍රගතිය		ප්‍රතිලාභීන් ගණන
	වැඩසටහන් ගණන	මුදල රු.	වැඩසටහන් ගණන	මුදල රු.	
01. ව්‍යාප්ති නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්	24	3,110,000.00	18	99,033.64	1,520
02. තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්	3	400,000.00	2	27,618.05	17
03. පොල් වගාකරුවන් හා බාහිර පාර්ශව සඳහා පවත්වන පුහුණු වැඩසටහන්	72	1,720,000.00	28	219,468.35	843

1.5.1 රෝග හා පළිබෝධ කළමනාකරණ වැඩසටහන

මෙහිදී ප්‍රධාන පළිබෝධ මර්දනය සඳහා ඒකාබද්ධ පළිබෝධ මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවාට අවශ්‍ය යෙදවුම් නිෂ්පාදනය හා ලබාදීම සිදුකරන අතර, හානි වර්ධන අවස්ථාව අනුව පෞද්ගලික උපදෙස් ලබා දී කඩිනමින් එහි තත්ත්වයන් පාලනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙනු ලැබේ. මෙම ප්‍රධාන වැඩසටහන් 2021 වර්ෂයේ ද පහත පරිදි ක්‍රියාත්මක කරන ලදී.

වගු අංක 1.15 : 2021 වර්ෂයේදී රෝග හා පළිබෝධ කළමනාකරණ වැඩසටහන්වල ප්‍රගතිය.

වැඩසටහන	වැඩසටහන	වැඩසටහන්/ ඒකක ගණන	ප්‍රගතිය	ඇස්තමේන්තුගත මුදල	ප්‍රගතිය
01. ඒකාබද්ධ රතු කුරුමිණි කළමනාකරණය	ඒකාබද්ධ රතු කුරුමිණි මර්දන වැඩසටහන්	19	12	1,149,500.00	443,760.88
	රතු කුරුමිණි පෙරමෝන නිෂ්පාදනය හා බෙදා හැරීම	38,000	12,000	3,420,000.00	1,080,000.00
	රතු කුරුමිණි පෙරමෝන නිෂ්පාදනය හා බෙදා හැරීම	19,000	12,000	2,850,000.00	2,017,275.00

	රතු කුරුමිණි පෙරමෝන විකිණීම	8,000	5,366		-
	මොනක්‍රොටපස් විකිණීම (ලීටර්)	2,000	1,960		
02. කළු කුරුමිණි මර්දන වැඩසටහන්	කළු කුරුමිණි පෙරමෝන විකිණීම	2,000	1,200		
03. පොල් දළඹු මර්දන වැඩසටහන	පොල් දළඹු මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්	7	2		
	පොල් දළඹු පරපෝෂිත නල නිෂ්පාදනය හා බෙදාහැරීම	2,500	BRACCON – 735 Gonniosis – 18 Bracameria - 23		
04. පොල් මයිටා මර්දන වැඩසටහන්	විලෝපික මයිටා පැකට් විකිණීම	5,000	-		-
	මයිටා මර්දන දැනුවත් කිරීමේ වැඩසටහන්	19	-		
05. වෙනත් රෝග හා පළිබෝධ මර්දන වැඩසටහන්	මර්දන වැඩසටහන්	58	1	555,500.00	-

1.5.2 <u>ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන</u>

පොල් වගාකිරීමේ මණ්ඩලයේ ජාතික ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මගින් ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන මගින් පොල් වගාකිරීමේ මණ්ඩලය පිළිබඳව හා එමගින් සිදුකරන ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම, පොල් වගා කිරීමේ මණ්ඩලයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ කෘෂිකාර්මික ව්‍යාප්තිය පිළිබඳව දැනුම හා ආකල්ප සංවර්ධනය, පොල් වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම බෙදා හැරීම මෙන්ම පොල් වගාකරුවන්ගේ ආකල්ප සංවර්ධනය, පොල් වගාකිරීමේ මණ්ඩලයේ ජාතික ව්‍යාප්ති හා සංවර්ධන වැඩසටහන් වලට අවශ්‍ය ව්‍යාප්ති ආධාරක නිර්මාණය, සැකසුම හා බෙදාහැරීම මෙන්ම අවශ්‍ය අනෙකුත් සහයෝගය ලබාදීම සිදුකරයි.

වගු අංක 1.16 : 2021 වර්ෂයේදී ව්‍යාප්ති හා ජනමාධ්‍ය වැඩසටහන් ප්‍රගතිය

විස්තරය	ඒකක ප්‍රමාණය	මුදල (රු.)
කෙටි වීඩියෝපට	13	345,000.00
www.cdtc.lk වෙබ් අඩවිය නඩත්තුව	1	9,000.00
සමාජ මාධ්‍ය තුළ පළකිරීම සඳහා අවශ්‍ය දැන්වීම්	30	-
ජාතික මට්ටමේ ප්‍රදර්ශන	5	321,000.00
පුවරු හා බැනර්	87	178,050.00
අත්පත්‍රිකා වර්ග 12	54,700	684,415.00

ප්‍රවෘත්ති පත්‍ර කලාප 2	1,000	89,000.00
පොල් ආශ්‍රිතව සකසාගත හැකි විවිධ අහාර වට්ටෝරු අත්පොත	1,000	775,000.00
දැනුවත් කිරීම සඳහා පෝස්ටර්	25,000	363,260.00
අක්කර 10ට වැඩි පොල් ඉඩම් හිමියන් සඳහා තාක්ෂණික උපදෙස් - චාරිකා	20	114,898.50
නව ව්‍යාප්තිකාරකයා පුහුණු මොඩියුල සිංහල භාෂාවට පරිවර්තනය - මොඩියුල	6	279,280.00
ඉගෙනුම් ආධාරක ලෙස 4GB pen drives	220	192,500.00
රැස්වීම් සහ උත්සව	8	43,637.79

2.0 ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය

2.1 ආදර්ශ පොල් උයන් අංශය

පොල් වගාකිරීමේ මණ්ඩලය සතුව ආදර්ශ පොල් උයන් 12ක් පවතින අතර, ඒවායින් අටක් වයඹ පළාතෙහි ද, තුනක් නැගෙනහිර පළාතෙහි ද, එකක් උතුරු පළාතෙහි ද පිහිටා ඇත. එක් එක් ආදර්ශ පොල් උයන්වල පිහිටීම, කෘෂි දේශගුණික කලාපය හා භූමි ප්‍රමාණය වගුව 2.1හි දක්වා ඇත.

වගු අංක 2.1 පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් ආදර්ශ පොල් උයන් පිළිබඳ තොරතුරු

ආදර්ශ පොල් උයන	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	කෘෂි දේශගුණික කලාපය	මුළු අක්කර ප්‍රමාණය
ලේනව	කුරුණෑගල	ඉබ්බාගමුව	අතරමැදි වියළි	483.31
ඩෙසිවැලි	කුරුණෑගල	මාවතගම	අතරමැදි තෙත්	306.00
ගර්ටිලන්ඩ්	කුරුණෑගල	පන්නල	අතරමැදි තෙත්	405.00
නාගන්සෝල	කුරුණෑගල	රස්නායකපුර	අතරමැදි වියළි	406.00
රන්දෙනිය	කුරුණෑගල	වාරියපොල	අතරමැදි වියළි	347.62
මහයාය	කුරුණෑගල	පන්නල	අතරමැදි වියළි	331.25
පලෙයි	කිලිනොච්චි	පච්චිලෙයිපලෙයි	පහතරට වියළි	492.00
කොරෙයි	අම්පාර	තිරුක්කෝවිල්	පහතරට වියළි	469.19
බෝපිටිය	කුරුණෑගල	පන්නල	අතරමැදි තෙත්	135.90
පාසිකුඩා	මඩකලපුව	කෝරලේපත්තු නැගෙනහිර	පහතරට වියළි	238.00
කොහොඹාන	අම්පාර	උහන	පහතරට වියළි	152.92
මුන්දලම	පුත්තලම	මුන්දලම	අතරමැදි වියළි	14.25
එකතුව				**3781.44**

ආදර්ශ පොල් උයන්වල ප්‍රධාන බෝගය පොල් වගාව වන අතර ආදර්ශ පොල් උයන්වලින් උපරිම ලාභයක් ලබාගැනීමේ අරමුණින් ආදායම් උත්පාදන ව්‍යාපෘති ලෙස අතුරු වගාකිරීම, සත්ව පාලනය, කොහු නිෂ්පාදනය, කොප්පරා නිෂ්පාදනය, සංචාරක නිවාස පවත්වාගෙන යාම, පොල් කටු අඟුරු නිෂ්පාදනය, පොල් ලෙලි චිප්ස් නිෂ්පාදනය, පොල් තෙල් නිෂ්පාදනය, පොල් පැළ නිෂ්පාදනය, අතුරු වගා පැළ නිෂ්පාදනය, කප්තුරුපාය අලෙවිසැල් පවත්වා ගෙනයාම සිදුකරයි. එසේම ආදර්ශ පොල් උයන්වල විභවය අනුව වී වගාකිරීම, රබර් වගාකිරීම, විලෝපිත මයිටා පැකට් නිෂ්පාදනය, පොල් සංචාරක ව්‍යාපෘතිය හා ග්ලිරිසීඩියා වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. පොල් වගා පාදක ලාභදායී ව්‍යාපාරයක් ලෙස ආදර්ශන මට්ටමින් ආදර්ශ පොල් උයන් පවත්වාගෙනයාම ප්‍රධාන අරමුණ වේ. එසේම පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය මගින් පොල් වගාකරුවන්, පාසල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල නිලධාරීන් හා කෘෂිකාර්මික සංවිධාන වල සමීති සාමාජිකයින් සඳහා සිදුකරනු ලබන පුහුණු වැඩසටහන් වලදී දැනුවත් කිරීම් සිදුකරයි. එසේම මෙම ආදර්ශ පොල් උයන් මගින් පුහුණුවන්නන්හට පොල් වගාව ලාභදායීව පවත්වා ගැනීම පිළිබඳ ප්‍රායෝගික මගපෙන්වීම හා පුහුණුව ලබාදීම සිදු කරයි.

ආදර්ශ පොල් උයන්වල නිමැවුම් ලෙස උසස් තත්වයේ බීජ පොල්, පොල් පැළ, මාළු පොල්, කොප්පරා, පොල් කටු අඟුරු, එළකිරි, මී කිරි, යෝගට්, කිරි ටොෆී, බිත්තර, එළවළු, පළතුරු, කුළු බඩු, රබර්, අතුරු බෝග පැළ, වී හා විලෝපිත මයිටා පැකට් පාරිභෝගිකයින් වෙත නිකුත් කරනු ලැබේ.


2021 වර්ෂයේ ගෙඩි 6,116,622 පොල් අස්වැන්නක් ආදර්ශ පොල් උයන් මගින් ලබා ඇත. 2020 වර්ෂයේ ලැබූ අස්වැන්න ගෙඩි 5,024,088 වන අතර එයට සාපේක්ෂව 2021 වර්ෂයේ ලැබූ අස්වැන්න ගෙඩි 1,092,534කින් වැඩි වී ඇත.

2021 වර්ෂයේ මුළු පොල් ආදායම රු 331,337,968.74ක් වූ අතර, මුළු වියදම රු. 126,185,654.61ක් විය. ඒ අනුව මුළු ලාභය රු. 205,152,314.13කි. සියලු ආදර්ශ පොල් උයන්වල 2021 වාර්ෂික පොල් නිෂ්පාදන ඉලක්කය, පොල් නිෂ්පාදන ප්‍රගතිය, මුළු ආදායම, මුළු වියදම, මුළු ලාභය, ගෙඩියක සාමාන්‍ය නිෂ්පාදන වියදම, ගෙඩියක සාමාන්‍ය විකුණුම් මිල හා ගෙඩියක ලාභය වගුව 2.2 හි දක්වා ඇත.


වගු අංක 2.2 ආදර්ශ පොල් උයන්වල පොල් අස්වැන්න, ආදායම, වියදම හා ලාභය (වෙන්දේසියේ අළෙවිය, මාළු පොල් අළෙවිය බීජ පොල් වටිනාකම සහ කොප්පරා වටිනාකම ඇතුළත්)

ආදර්ශ පොල් උයන	වාර්ෂික ඉලක්කය (ගෙඩි)	වාර්ෂික නිෂ්පාදනය 2021 (ගෙඩි)	පසුගිය වසරේ ප්‍රගතිය 2020 (ගෙඩි)	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
ලේනව	925,000	857,708	726,637	45,361,832.21	17,421,793.24	27,940,038.97
ඩෙඩිවැලි	950,000	881,327	658,698	43,642,972.37	19,937,552.86	23,705,419.51
ගර්ටිලන්ඩ්	825,000	854,331	649,830	49,214,508.80	15,662,585.81	33,551,922.99
නාගන්සෝල	825,000	767,547	663,314	39,184,752.83	13,187,836.05	25,996,916.78
රන්දෙනිය	825,000	617,767	600,900	32,481,614.25	14,760,947.32	17,720,666.93
මහයාය	825,000	870,795	621,705	48,450,272.69	13,264,268.48	35,186,004.21
පලෙයි	270,000	250,610	142,544	15,289,306.41	5,829,813.28	9,459,493.13
කොරෙයි	325,000	235,293	268,957	11,463,010.74	6,415,283.18	5,047,727.56
බෝපිටිය	325,000	292,249	261,886	16,822,544.68	7,065,134.77	9,757,409.91
පාසිකුඩා	250,000	219,402	146,717	14,880,508.77	6,265,522.37	8,614,986.40
කොහොඹාන	280,000	196,273	222,893	9,972,338.02	4,529,500.61	5,442,837.41
මුන්දලම	75,000	73,320	60,127	4,574,306.97	1,845,416.64	2,728,890.33
එකතුව	**6,700,000**	**6,116,622**	**5,024,208**	**331,337,968.74**	**126,185,654.61**	**205,152,314.13**

රූපය 2.1 වාර්ෂික පොල් ගෙඩි ඉලක්කය ,නිෂ්පාදනය , පසුගිය වසරේ ප්‍රගතිය පහත ප්‍රස්තාරයේ දක්වා ඇත.



රූපය 2.2 ආදර්ශ පොල් උයන් වල වාර්ෂික පොල් ආදායම, වියදම හා ලාභය ප්‍රස්තාරයේ දක්වා ඇත.



ආදර්ශ පොල් උයන්වල 2021 වර්ෂයේදී කොප්පරා කි.ග්‍රෑ 110951.50ක් නිෂ්පාදනය කරන ලද අතර එමගින් රු. 27,561,169.59ක ආදායමක් ලබාගෙන ඇත. වාර්ෂික වියදම රු. 4,470,265.89ක් වූ අතර රු. 23,090,903.70ක ලාභයක් කොප්පරා නිෂ්පාදනයෙන් ලබාගෙන ඇත.

එක් එක් ආදර්ශ පොල් උයන් මගින් අහුරු ක්‍රි.ග්‍රෑ 88,991 නිෂ්පාදනය කරන ලද අතර එමගින් රු.2,825,963.25ක ආදායමක් ලබාගෙන ඇත. වාර්ෂික වියදම රු.266,920.69ක් වූ අතර ලාභය රු. 2,559,042.56 අහුරු නිෂ්පාදනය මගින් ලබාගෙන ඇත.

2.1.1 බීජ පොල් නිෂ්පාදනය

2021 වර්ෂයේදී ආදර්ශ පොල් උයන් මගින් බීජ පොල් 925,776ක් නිෂ්පාදනය කරන ලද අතර, ආදර්ශ පොල් උයන් අනුව එහි විස්තර වගුව 2.3 මගින් දක්වා ඇත.

වගු අංක 2.3 2021 වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල නිෂ්පාදනය කර ඇති බීජ පොල් ප්‍රමාණය

ආදර්ශ පොල් උයන	නිෂ්පාදනය කල බීජ පොල් ප්‍රමාණය (ගෙඩි)
ලේනව	179,234
ඩෙසිවැලි	144,060
ගර්ටිලන්ඩ්	93,341
නාගන්සෝල	123,910
රන්දෙනිය	101,274
මහයාය	61,719
පලෙයි	58,000
කොරෙයි	23,686
පාසිකුඩා	76,600
කොහොඹාන	38,502
මුන්දලම	25,450
එකතුව	**925,776**

2.1.2 පොල් ලෙලි චිප්ස් නිෂ්පාදනය

පැළ නිෂ්පාදනය සඳහා භාවිතා වන කොහුබත් වෙනුවට ආදේශකයක් ලෙස පොල් ලෙලි චිප්ස් භාවිතා කළ හැක. කොහුබත් මිලට ගැනීම සඳහා වාර්ෂිකව වැය වන මුදල අවම කිරීම සඳහා ආදර්ශ පොල් උයන් සතු පොල් ලෙලි වලින් චිප්ස් කැබලි කපා කොහුබත් වෙනුවට භාවිතා කිරීම සිදුකරන අතර, මුදලට අලෙවි කිරීමත් සිදු කරනු ලබයි.

වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ නාගන්සෝල ආදර්ශ පොල් උයනේ පොල් ලෙලි නිෂ්පාදිත ප්‍රමාණය කියුබ් 90.5 වන අතර, එහි අලෙවි ප්‍රමාණය පොල් ලෙලි කියුබ් 90.5ක් වේ. පොල් ලෙලි කැබලි නිෂ්පාදන ආදායම රු. 605,750.00ක් සහ එහි වියදම රු. 601,884.12 වූ අතර ලාභය රු.3,865.88ක් ලබාගෙන ඇත.

2021 වර්ෂයේදී ක්‍රියාත්මක වූ කොහු නිෂ්පාදන ව්‍යාපෘතිය ආදර්ශ පොල් උයන් 03ක ක්‍රියාත්මක වූ අතර, නිෂ්පාදිත කොහු කි.ග්‍රෑ 14,240ක් සහ කොහුබත් කි.ග්‍රෑ 9,192.5ක් වේ. එමගින් රු. 2,290,505.00ක ආදායමක් ද රු. 1,449,428.02ක ලාභයක් ද උපදවා ඇත.

2.1.3 පොල් වගාකිරීමේ වැඩසටහන

(නව වගාව, යටි වගාව, පුරප්පාඩු සිටුවීම)

2021 වර්ෂයේ අලුතින් පොල් වගාකිරීම, නැවත/ යටි වගාකිරීම හා පොල් වගාවේ පුරප්පාඩු සිටුවීම මගින් පොල් වගාව වැඩි කිරීමත් හා පවතින පොල් වගාවේ ගහන ඝනත්වය වැඩි කිරීමත් සිදුකරන ලදී.

- ආදර්ශ පොල් උයන් අනුව නව වගාව අක්කර 53ක් සඳහා පොල් පැළ 22,782ක් ද
- යටි වගාව අක්කර 56 ක් සඳහා පොල් පැළ 4,328ක් ද
- පුරප්පාඩු සිටුවීම සඳහා පුරප්පාඩු පැළ 7,750ක් ද අවශ්‍ය වේ.

2.1.4 ආදර්ශ පොල් උයන් වල ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්

ආදර්ශ පොල් උයන්වල ඵල දරන වගාවේ සහ පැළ වගාවේ සිදු කරනු ලබන ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මගින් පොල් වගා භූමියේ භෞතික, ජීව විද්‍යාත්මක හා රසායනික තත්ත්වය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. එසේම පස සෝදායාම වැළැක්වීමත්, පසේ තෙතමනය සංරක්ෂණය කිරීමත් මෙම කාර්යයන්ගෙන් සිදුකරනු ලබන අතර, රෝග පළිබෝධ මර්දනය මගින් වගාවේ ආරක්ෂාව තහවුරු කිරීමත් සිදු කෙරේ. 2021 වර්ෂයේ එක් එක් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් වල ප්‍රගතිය ආදර්ශ පොල් උයන් අනුව පහත දැක්වේ.

2.1.4.1 මාර්ග හා බෝක්කු

සියලුම ආදර්ශ පොල් උයන්වල මීටර් 49,833 ක මාර්ග හා බෝක්කු අළුත්වැඩියා කර ඇති අතර, ආදර්ශ පොල් උයන් අනුව ප්‍රගතිය මීටර 49,833 වේ.
ආදර්ශ පොල් උයන්වල ආරක්ෂාව සඳහා සිදු කරනු ලබන නව වැටවල් සකස් කිරීම මීටර් 1,500 හා පවතින වැටවල් අළුත්වැඩියා කිරීම මීටර් 73,999ක් වේ.

2.1.4.2 වල් මර්ධනය

ආදර්ශ පොල් උයන්වල වල් මර්දනය කම්කරුවන් මගින්, රසායනික ද්‍රව්‍ය මගින්, යාන්ත්‍රික ක්‍රම මගින් හා සතුන් මගින් යන ආකාර 4 මගින් සිදුකරනු ලබයි. වසර පුරා වරින්වර සිදුකරන ලද වල් මර්දන අල්ලි 489,406 වේ.

2.1.4.3 කාණු යෙදීම, ලෙලි වැළලීම

පොල් වගාවේ පවතින තෙතමනය සංරක්ෂණය කිරීම සඳහා සමෝච්ඡ කාණු යෙදීම හා ලෙලි වලවල් යෙදීමත් වැඩිපුර ජලය බැසයාම සඳහා ජල බස්නා කාණු යෙදීමත් සිදුකරනු ලබන අතර 2021 වර්ෂයේ සිදුකරන ලද කාණු යෙදීම, අළුත්වැඩියාව හා ලෙලි වලවල් යෙදීමේ ප්‍රගතිය දක්වා ඇත.

වගු අංක 2.4 පොල් වගාවේ කාණු යෙදීම හා ලෙලි වැළලීම.

ආදර්ශ පොල් උයන්	සමෝච්ජ කාණු යෙදීම හා අළුත්වැඩියාව (මීටර්)	ජල බස්නා කාණු යෙදීම හා අළුත්වැඩියාව (මීටර)	ලෙලි වැලලීම (වලවල් ගණන)
ලේනව	288	-	193
ඩෙසිවැලි	1760	-	400
ගර්ට්ලන්ඩ්	-	1881	800
නාගන්සෝල	1070	1712	385
රන්දෙනිය	2240	-	57
මහයාය	-	1610	677
පලෙයි	-	490	104
කොරෙයි	-	3772	206
බෝපිටිය	-	-	-
පාසිකුඩා	-	-	186
කොහොඹාන	-	4792	150
මුන්දලම	80	2015	-
එකතුව	5438	16272	3158

2.1.4.4 ආස්තරණ යෙදීම ,ආවරණ බෝග වගාව හා සී සෑම

2021 වර්ෂයේදී ආදර්ශ පොල් උයන්වල තෙතමනය සංරක්ෂණය සඳහා පොල් ගස වටා ආස්තරණ යෙදීම එක් වසරක් තුළ අවස්ථා කීහිපයකදී සිදුකරනු ලබයි. එයට අමතරව පොල් වගාවේ ආවරණ බෝග වගාව හා සී සෑම ද සිදුකරනු ලබයි. එය පහත පරිදි වේ.

- ආදර්ශ පොල් උයන් වල සී සෑම (අල්ලි) 22,517
- ආස්තරණ යෙදීම ගස් 156,879
- ආවරණ බෝග වගාව (අල්ලි) 4,032.5

2.1.4.5 කාබනික පොහොර යෙදීම

පසේ භෞතික තත්වය වැඩිදියුණු කිරීමත්, එහි පෝෂක සංසටක වැඩිකිරීමත්, පාංශු ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමත් මගින් පොල් වගාවේ පාංශු තත්වය දිගුකාලීනව සංවර්ධනය සඳහා වගාවට කාබනික පොහොර යෙදීම සිදු කරයි. ප්‍රදේශයේ සුලභතාවය අනුව කාබනික පොහොර ලෙස කුකුළු පොහොර, ගොම පොහොර, එළු/බැටළු පොහොර හා කොම්පෝස්ට් යෙදීම සිදු කරයි. ආදර්ශ පොල් උයන් සඳහා කාබනික පොහොර යෙදීමේ ප්‍රගතිය අනුව කාබනික පොහොර යෙදූ ගස් ගණන 11,940 සහ ක්‍රි.ග්‍රෑ ප්‍රමාණය 257,945 වේ.

2.1.5 අතුරු වගා වැඩසටහන

පොල් වගාව සිදුකරනු ලබන භූමිවල පොල් වගාවේ පරතරය හේතුවෙන් භූමි භාවිතයෙන් 2/3 ඉඩ ප්‍රමාණයක් ඉතිරිවන අතර, මෙම ඉඩකඩ ප්‍රමාණය තුළ වෙනත් වගා සිදුකළ හැක. අවුරුදු 5 ට අඩු හා අවුරුදු 35 ට වැඩි පොල් වගාව තනි වගාවක් ලෙස සිදුකරන භූමිවල අතුරු වගාකිරීම සිදුකිරීමේ හැකියාව ඇත. ඒ අනුව එම ඉඩකඩ ප්‍රමාණය භාවිතා කොට කෙටි කාලීන බෝග හා දිගු කාලීන බෝග අලුතින් වගාකිරීමත් පවතින අතුරු වගා නඩත්තු කිරීමත් සිදුකර ඇත. අතුරු වගා ලෙස කෙටි කාලීන එළවළු වර්ග, අල වර්ග, ඖෂධ වර්ග, කුළුබඩු වර්ග, මාෂ බෝග, ධාන්‍ය හා පලතුරු බෝග වගාකර ඇත.

2.1.6 වී වගාව

ලේනව, රන්දෙනිය, ගර්ට්ලන්ඩ්, මහයාය, කොහොඹාන හා නාගන්සෝල ආදර්ශ පොල් උයන්වල වී වගා වැඩසටහන 2021 වර්ෂයේදී ක්‍රියාත්මක විය. ඉන් ආදර්ශ පොල් උයන් 04ක අක්කර 51ක වී වගාව අඳ ගොවීන් මගින් සිදුකර ඇති අතර, මහයාය හා කොහොඹාන ආදර්ශ පොල් උයන් මගින් අක්කර 1.25 ක ප්‍රමාණයක වී වගාකර ඇත. සමස්ත වී වගා ආදායම රු. 2,376,213.75 වියදම රු. 522,956.77 එහි ලාභය රු. 1,853,256.98 ක් වන අතර නිෂ්පාදිත වී ප්‍රමාණය කි.ග්‍රෑ 33,031ක් වේ.

2.1.7 බීජ පොල් තවාන් කිරීම

2021 වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල බීජ පොල් තවාන් කිරීමේ ප්‍රගතිය පහත වගුවේ දක්වා ඇත.

වගුව **2.5** **බිජ පොල් තවාන් කිරීමේ ප්‍රගතිය**

ආදර්ශ පොල් උයන	බිජ පොල් ලැබීම හා තවාන් කිරීම
	බඳුන් පැළ
ලේනව	22143
ඩෙසිවැලි	117004
ගර්ටිලන්ඩ්	101170
නාගන්සෝල	53080
රන්දෙනිය	66704
මහයාය	42904
පලෙයි	149753
කොරෙයි	42641
බෝපිටිය	88650
පාසිකුඩා	130438
කොහොඹාන	49825
මුන්දලම	53050
එකතුව	**917362**

2021 වර්ෂයේදී ආදර්ශ පොල් උයන්වල පොල් පැළ තවාන්වල පැළ නිෂ්පාදන ප්‍රගතිය වගුවෙහි දක්වා ඇත.

වගුව අංක **2.6** **- පොල් පැළ නිෂ්පාදන ප්‍රගතිය**

ආදර්ශ පොල් උයන	බිම් පැළ		බඳුන් පැළ		එකතුව
	යල කන්නය	මහ කන්නය	යල කන්නය	මහ කන්නය	
ලේනව	-	10586	19822	16870	47278
ඩෙසිවැලි	-	11662	11267	20440	43369
ගර්ටිලන්ඩ්	-	-	9229	7672	16901
නාගන්සෝල	-	-	24219	-	24219
රන්දෙනිය	-	-	11200	10420	21620
පලෙයි	-	-	7179	7296	14475
කොරෙයි	-	-	5570	3756	9326
කොහොඹාන	-	-	6120	28760	34880
මුන්දලම	-	900	5127	12788	18815
එකතුව	**-**	**23148**	**99733**	**108002**	**230883**

ආදර්ශ පොල් උයන් මගින් 2021 වර්ෂයේදී පොල් පැළ නිකුත් කිරීමේ ප්‍රගතිය වගුව 2.7 හා ආදායම්, වියදම් ප්‍රගතිය වගු අංක 2.8 හි දක්වා ඇත.

වගුව අංක 2.7 පැළ නිකුත් කිරීම් ප්‍රගතිය

ආදර්ශ පොල් උයන	නිකුත් කළ පොල් පැළ ගණන		එකතුව
	බිම් පැළ	බදුන් පැළ	
ලේනව	367	22143	22510
ඩෙසිවැලි	6880	16882	23762
ගර්ටිලන්ඩ්	437	11490	11927
නාගන්සෝල	-	23069	23069
රන්දෙනිය	-	9396	9396
මහයාය	370	9393	9763
පලෙයි	-	10485	10485
කොරෙයි	-	7138	7138
බෝපිටිය	-	11716	11716
පාසිකුඩා	238	13549	13787
කොහොඹාන	-	5745	5745
මුන්දලම	60	5622	5682
එකතුව	**8352**	**146628**	**154980**

වගුව 2.8 - පොල් පැළ නිෂ්පාදන ආදායම, වියදම හා ලාභය

ආදර්ශ පොල් උයන	ආදායම (රු.)	වියදම (රු.)	ලාභය (රු.)
ලේනව	16,928,161.14	6,861,655.64	10,066,505.50
ඩෙසිවැලි	25,986,738.21	8,704,970.93	17,281,767.28
ගර්ටිලන්ඩ්	12,337,269.77	8,023,215.36	4,314,054.41
නාගන්සෝල	12,545,285.14	7,596,444.69	4,948,840.45
රන්දෙනිය	12,863,620.83	6,311,120.49	6,552,500.34
මහයාය	9,716,847.86	4,881,558.24	4,835,289.62
පලෙයි	26,458,200.74	14,036,008.52	12,422,192.22
කොරෙයි	5,568,747.49	3,395,214.01	2,173,533.48
බෝපිටිය	16,640,838.90	9,189,355.14	7,451,483.76
පාසිකුඩා	22,678,602.89	1,362,038.95	21,316,563.94

කොහොඹාන	7,437,212.17	3,803,381.46	3,633,830.71
මුන්දලම	10,335,940.10	7,069,010.00	3,266,930.10
එකතුව	**179,497,465.24**	**81,233,973.43**	**98,263,491.81**

2.1.8 සත්ව පාලන වැඩසටහන

ඒකීය බෝගයක් ලෙස පොල් වගාකිරීමට වඩා පොල් වගාව සමග අතුරු වගාකිරීම හා සත්ව පාලනය කිරීම මගින් ආදර්ශ පොල් උයනේ භූමි ඵලදායීතාවය ඉහළ නැංවීම සිදුකරයි. ආදර්ශ පොල් උයනේ පවතින විභවය අනුව තෝරාගත් සත්ව පාලන ව්‍යාපෘති ක්‍රියාවට නංවන අතර, ඒ යටතේ එළ ගවයන්, මී ගවයන්, එළුවන් හා බැටළුවන් ඇති කරනු ලබයි. සත්ව නිෂ්පාදන වැඩසටහන යටතේ දියර කිරි, මුදවපු කිරි, යෝගට් ප්‍රධාන වශයෙන්ද කිරි ටොෆී සුළු වශයෙන්ද නිෂ්පාදනය කර අලෙවි කරනු ලබන අතර, අභිජනන කටයුතු සඳහා ගොවීන්ට සහන මිලට සතුන් අලෙවි කරනු ලැබේ. ආදර්ශ පොල් උයනේ කාබනික පොහොර අවශ්‍යතාවයෙන් යම් ප්‍රමාණයක් ද මෙමගින් සපයනු ලැබේ. විශ්ව විද්‍යාල සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහා ද සත්ව පාලන ව්‍යාපෘති උපකාරී වී ඇත.

වගුව 2.9 - 2021.12.31 දිනට සත්ව පාලන ව්‍යාපෘතිවල සමස්ත ආදායම,වියදම හා ලාභය

සත්ව පාලන ව්‍යාපෘතිය	**ආදායම (රු.)**	**වියදම (රු.)**	**ලාභය (රු.)**
ගව පාලනය	8,861,355.29	2,422,118.41	**6,439,236.88**
එළු පාලනය	2,481,160.00	1,254,261.17	**1,226,898.83**
බැටළු පාලනය	532,962.00	532,908.00	**54**
මී ගව පාලනය	9,782,242.64	2,723,714.23	**7,058,528.41**
එකතුව	**21,657,719.93**	**6,933,001.81**	**14,724,718.12**

2.1.9 විලෝපිත මයිටා නිෂ්පාදනය හා ආදර්ශ පොල් උයන්වල භාවිතය

ආදර්ශ පොල් උයන්වල ඇති මයිටාවන්ගේ හානිය නිසා අස්වැන්නේ පැහැදිලි අඩුවීමක් සිදු වේ. ගෙඩි කුඩාවීම, ගෙඩිවල ගුණාත්වය අඩුවීම හා අස්වැන්න අඩුවීම මයිටා හානිය නිසා සිදුවේ. එසේම ලෙලි වල ප්‍රමාණය කුඩා වීම හේතුවෙන් ලෙලි ඉවත් කිරීම අපහසු වීමත්, ලෙලිවල ආදායම අඩුවීමත් හේතුවෙන් පොල් අස්වැන්නේ ආදායම අඩුවීම සිදුවේ. මයිටාවන් ජෛව විද්‍යාත්මක ක්‍රම මගින් මර්දනය සඳහා විලෝපිත මයිටාවන් භාවිතා කරනු ලබන අතර මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වූ රසායනාගාර 10ක් ඇත.

ආදර්ශ පොල් උයන්වල මයිටා මර්දනය සඳහා විලෝපිත මයිටාවන් භාවිතා කළ අතර, එහි ප්‍රගතිය වගුව 2.10 හි දක්වා ඇත.

වගුව 2.10 ආදර්ශ පොල් උයන්වල විලෝපිත මයිටාවන් භාවිතය

ආදර්ශ පොල් උයන	යෙදූ විලෝපිත මයිටා පැකට් ගණන
ලේනව	1960
ඩෙසිවැලි	2400
ගර්ටිලන්ඩ්	5500
නාගන්සෝල	2000
රන්දෙනිය	3490
මහයාය	4000
පලෙයි	2544
කොරෙයි	3733
බෝපිටිය	2500
පාසිකුඩා	2100
කොහොඹාන	2450
මුන්දලම	100
එකතුව	**32777**

2.1.10 <u>කප්තුරුපාය අලෙවිසැල් ව්‍යාපෘතිය</u>

පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් නිෂ්පාදනය කරනු ලබන බෝග, ද්‍රව්‍ය හා පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම මූලික අරමුණු කරගෙන කප්තුරුපාය වෙළඳසැල් ආරම්භ විය. අවම මිල ගණන් මත ඉහළ ගුණත්මක තත්ත්වයේ පොල් වගාව ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම කප්තුරුපාය අලෙවිසැල් තුළ සිදු කරයි.

2.1.11 සංචාරක නිවාස ව්‍යාපෘතිය

රූපය 2.3 පොළොන්නරුව සංචාරක නිවාසය



රූපය 2.4 කතරගම සංචාරක නිවාසය



වගු අංක **2.11** සංචාරක නිවාසවල තොරතුරු - 2021

අනු අංකය	සංචාරක නිවාසය	ලිපිනය
01	පාසිකුඩා සංචාරක නිවාසය	පාසිකුඩා ආදර්ශ පොල් උයන, පාසිකුඩා,කල්කුඩා
02	පලෙයි සංචාරක නිවාසය	පලෙයි ආදර්ශ පොල් උයන, නුවර පාර,පලෙයි
03	බෝපිටිය සංචාරක නිවාසය	බෝපිටිය ආදර්ශ පොල් උයන, කු/බෝපිටිය
04	කොහොඹාන සංචාරක නිවාසය	කොහොඹාන ආදර්ශ පොල් උයන, ගොනාගොල්ල, කොහොඹාන
05	හඳපානාගල සංචාරක නිවාසය	හඳපානාගල පොල් පැළ තවාන, හඳපානාගල, වෙහෙරයාය
06	කටුකැලියාව සංචාරක නිවාසය	මහිලා මාවත,කටුකැලියාව,අනුරාධපුරය
07	කතරගම සංචාරක නිවාසය	කොකෝවිලා සංචාරක නිවාසය, පොල් වගාකිරීමේ මණ්ඩලය, ඩිපෝව පාර, කතරගම
08	කුඹුරුපිඩ්ඩි සංචාරක නිවාසය	කුඹුරුපිඩ්ඩි පොල් පැළ තවාන, කුඹුරුපිඩ්ඩි, ත්‍රිකුණාමලය
09	පුලතිසි කොකෝවිලා	සංචාරක නිවාසය, පොල් වගාකිරීමේ මණ්ඩලය, කලහගල පාර, නව නගරය, පොළොන්නරුව.

2.2 පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් සංවර්ධන වැඩසටහන

2.2.1 පොල් පැළ නිෂ්පාදන සහ පැළ නිකුත් කිරීමේ වැඩසටහන

දිවයිනේ වගාකිරීමට අවශ්‍ය උසස් තත්වයේ පොල් පැළ නිෂ්පාදනයකර වගාකරුවන්ට සැපයීම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. ව්‍යාප්ති හා සංවර්ධන අංශයේ සැලසුම්වලට අනුව වර්ෂයේ පැළ නිෂ්පාදනයට අවශ්‍ය බීජ පොල් තවාන් වෙත සැපයීම සැලසුම් කිරීම, මෙහෙයවීම හා සම්බන්ධීකරණය, පැළ නිෂ්පාදනය, ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය මගින් සිදු කෙරේ. පොල් පැළ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය කාර්යාල, තවාන්, ආදර්ශ පොල් උයන් හා මීගමුව බීජ පොල් ඒකකය ප්‍රධාන වශයෙන් දායකවේ.

ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ මග පෙන්වීම හා නේවාසික තවාන් භාර නිලධාරීගේ සෘජු අධීක්ෂණය යටතේ පොල් පැළ නිෂ්පාදනය ප්‍රධාන කාර්යය කරගත් පොල් පැළ තවාන් 39ක් මගින් සහ ආදර්ශ පොල් උයන් භාර කළමනාකරුවන්ගේ සෘජු අධීක්ෂණය හා මග පෙන්වීම යටතේ ආදර්ශ පොල් උයන් 12 තුළ ස්ථාපිත පොල් පැළ තවාන් මගින් වගාකරුවන්ට අවශ්‍ය උසස් තත්වයේ ගුණාත්මක පොල් පැළ නිෂ්පාදනය කෙරේ.

පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන් සහ ආදර්ශ පොල් උයන් සඳහා අවශ්‍ය උසස් ගුණාත්මයෙන් යුතු බීජ පොල් සපයන ප්‍රධාන කේන්ද්‍රස්ථානය ලෙස මීගමුව බීජ පොල් ඒකකය ක්‍රියා කරයි.

පොල් වගාකරුවන් සඳහා අවශ්‍යවන උසස් ගුණාත්මයෙන් යුතු පොල් පැළ කාර්යක්ෂමව සැපයීමේ අරමුණින් මණ්ඩලයට අයත් පොල් පැළ තවාන් දිවයින පුරා ස්ථාපිත කර ඇති අතර, ඉන් වැඩි ප්‍රමාණයක් පොල් වගාව වඩාත් ප්‍රචලිතව පවතින වයඹ පලාත තුළ පවතී. ප්‍රාදේශීය පොල් පැළ තවාන්වල කටයුතු ඒ ඒ ප්‍රාදේශීය කාර්යාල මගින් පාලනය හා නඩත්තුව සිදු කරනු ලබයි.

2.2.1.1 පොල් පැළ ඉලක්කයන්

2021 වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් 2021 වර්ෂයේදී පොල් පැළ මිලියන 4 ක් නිෂ්පාදනය කිරීමට ඉලක්ක කරන ලදී.
(පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් 2021වර්ෂයේදී පොල් පැළ නිෂ්පාදනය කරන ලද ආකාරය පහත වගුවෙන් දක්වා ඇත)

වගු අංක **2.12 : 2021 වර්ෂය තුල පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් හා ආදර්ශ පොල් උයන් මගින් නිකුත් කරන ලද පොල් පැළ ප්‍රමාණයන් (2021.01.01- 2021.12.31 දක්වා)**

ප්‍රාදේශීය කාර්යාලය		ප්‍රා. කා.යට අයත් තවානේ නම	බීම් පැළ	බදුන් පැළ						
				DT	TT	MT	PP	KC	TSR	Other
1	අනුරාධපුර	කළාවැව	33,549	-	29,407	9,897	30,584	808		
2	අම්පාර	උහන	10,709	301	12,170	-	39,063	484	-	12,078
3	ගාල්ල	ලබ්බුවු	-	-	14,940	-	3,396	-	-	-
		බද්දේගම	21,323	-	11,598	11,493	12,422	500	-	-
4	ගම්පහ	කිරිඳිවැල	25,458	847	4,351	4,625	7,048	1,302	-	-
		වල්පිට	30,157	-	14,264	7,582	15,039	462		
5	හම්බන්තොට	මයුරපුර	31,161	-	4,364	-	7,145	-	-	-
		මැදමුලන	36,978	2	22,462	-	16,788	1,156	-	-
6	යාපනය	අලම්පිල්	22,127	-	870	-	4,320	-	-	-
		අච්චුවේලි	23,634	-	1,239	-	4,848	72	-	-
		කිළිනොච්චි	20,925	-	3,749	-	1,969	-	-	-
		දේවිපුරම්	11,829	-	11,221	-	2,719	-	-	-
7	කළුතර	කොරොස්දුව	26,142	-	18,154	19,552	4,293	2,268		
8	කෑගල්ල	එරමිණිගොල්ල	12,174	160	3,565	14,197	8,679	193	381	
		පොල්ගහවෙල	16,414	-	8,824	5,909	14,158	1,186	-	-
		මත්තමගොඩ	12,904	-	6,882	11,113	23,383	49		
9	කුලියාපිටිය	බින්ගිරිය	31,072	16,789	22,903	-	2,678	334		
		දියදොර	20,315	-	7,450	3,644	15,760	841		
		හෙට්ටිපොළ	25,795	1,507	19,368	2,188	7,444	144		
		කන්දෙටිය	21,771	-	5,094	-	17,614	592	656	-
10	කුරුණෑගල	ඉබ්බාගමුව	31,774	504	2,707	14,133	31,952	395		
		වාරියපොළ	39,382	-	13,217	496	10,946	50		
		නිකවැරටිය	27,848	-	14,885	-	35,091	219		
		වෙන්නොරුව	15,771	927	9,901	5,815	23,842	268		
11	මඩකලපුව	මයිලම්බාවැළි	19,115	-	28,019	-	11,386	609	-	
12	මාරවිල	අට්ටවිල්ලුව	64,332	-	12,144	-	7,474	468	-	100
		කිරිමැටියාන	52,779	79	20,056	3,282	4,806	379	-	-
		විල්පොත	78,676	-	10,558	-	5,019	-	-	-
13	මාතලේ	දොඩන්ගස්ලන්ද	17,071	-	4,390	7,483	21,235	-	-	-
		පල්ලෙකැලේ	9,371	-	7,540	5,601	19,865	715	-	8,045
14	මොණරාගල	හඳපානගල	24,293	-	20,213	-	7,929	1,206	-	-
		වැලිපිටිය	21,761	-	10,466	6,199	7,871	64	-	-
15	පොළොන්නරුව	පරාක්‍රම සමුද්‍රය	12,072	-	24,807	404	24,976	438		
		උල්හිටිය	6,892	-	16,483	-	12,782	-		
16	රත්නපුර	ඇඹිලිපිටිය	37,220	-	17,988	8,176	16,412	1,320	2,023	-
17	ත්‍රිකුණාමලය	කුඹුරුපිඩිඩි	17,485	-	-	20,174	19,781	199	-	-
		සේරුවිල	6,057	-	3,517	-	595	-	-	-
18	වව්නියා	මඩු	31,097	-	3,967	-	3,860	169	-	-
19	මහයාය		-	-	8,343	1,973	13,542	8,968	1,077	-
මුළු පැළ නිකුත් කිරීම			***947,433***	***21,116***	***452,076***	***163,936***	***518,714***	***25,858***	***4,137***	***20,223***

ආදර්ශ පොල් උයනේ නම		බීම් පැළ	බඳුන්පැළ						
			DT	TT	MT	PP	KC	TSR	Other
1	ඩෙසිවැලි	6,880				16,882			
2	පාසිකුඩා	238				13,549			
3	රන්දෙනිය	0				9,396			
4	ගර්ටිලන්ඩ්	437				11,490			
5	බෝපිටිය	0				11,716			
6	මහයාය	370				9,393			
7	මුන්දලම	60				5,622			
8	ලේනව	367				22,143			
9	පලෙයි	0				10,485			
10	කොරෙයි	0				7,138			
11	කොහොඹාන	0				5,745			
12	නාගන්සෝල	0				23,069			
මුළු පැළ නිකුත් කිරීම		***8,352***	***0***	***0***	***0***	***146,628***	***0***	***0***	***0***
මුළුපැළ නිකුත් කිරීම තවාන් සහ ආ.පො.උ.		***955,785***	***21,116***	***452,076***	***163,936***	***665,342***	***25,858***	***4,137***	***20,223***
		955,785	**1,352,688**						
		2,308,473							

2021 වර්ෂයට අදාළව පොල් පැළ මිලියන 4ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කළ අතර, ඒ අනුව 2021 වර්ෂයට අවශ්‍ය පොල් පැළ ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා මණ්ඩලයේ තවාන් හා ආදර්ශ පොල් උයන් වෙත, සපයා ඇති සමස්ත බීජ පොල් ප්‍රමාණය 4,606,423කි. 2021 යල කන්නයේ පැළ ලබා ගැනීම සඳහා බීජ පොල් 964,633ක් ද, 2021 මහ කන්නයේ පැළ ලබා ගැනීම සඳහා බීජ පොල් 3,641,790ක් ද, තවාන් සහ ආදර්ශ පොල් උයන් වෙත සපයා ඇත. මේ අනුව 2021 වසර තුළ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශයෙන් පොල් පැළ මිලියන 2.3ක්, වගා කරුවන් වෙත ලබා දී ඇත. 2021 වර්ෂයේ නිපදවීම සඳහා තවාන් මගින් කරන ලද බීජ පොල් වලින් පැළ 687541ක් 2022 වසර සඳහා නිකුත් කිරීමට ඉතිරි වී ඇති අතර එම පොල් පැළ 2022 ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් යන මාසවලදී නිකුත් කිරීමට හැකිවනු ඇත.

2.2.2 විශේෂිත වැඩසටහන්

2.2.2.1 තැඹිලි බීජ උද්‍යානය ස්ථාපනය කිරීම හා නව පොල් පැළ සිටුවීමේ වැඩසටහන්

a) උසස් ගුණාත්මයෙන් යුතු තැඹිලි බීජ ලබා ගැනීම සහ මෙම බීජ එකතු කිරීමේදී වැයවන මුදල් අවම කර ගැනීම සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලය සතු තැඹිලි බීජ උයනක් නිර්මාණය කිරීමේ අරමුණින් කන්දෙටිය තවානේ තැඹිලි පැළ 450 ක් සිටුවීම.

b) PP වර්ගයේ බඳුන් පොල් පැළ 400ක් උල්හිටිය තවානෙහි සිටුවීම.

2.2.2.2 මී මැසි පාලන ව්‍යාපෘතිය

තවාන තුළ මී මැසි ජනපද ව්‍යාප්ත කිරීම තුලින් පරාගනය සිදුකිරීම සහ අමතර ආදායමක් ලබා ගැනීම සඳහා මී මැසි පාලන ව්‍යාපෘති ආරම්භ කිරීම.

a) මී මැසි පෙට්ටි 03ක් පල්ලෙකැලේ තවාන තුළ ස්ථාපනය කිරීම.

b) වල්පිට තවානෙහි මී මැසි පෙට්ටි 03ක් ස්ථාපනය කිරීම.

c) මී මැසි පෙට්ටි 04ක් උල්හිටිය තවානේ සවිකිරීම.

d) කිරිමැටියාන තවානෙහි මී මැසි පෙට්ටි 03ක් ස්ථාපනය කිරීම.

2.2.2.3 කොන්ක්‍රීට් තවාන් පාත්ති සැකසීම

2016 වර්ෂයේ සිදුකරන ලද පරීක්ෂණයක් මගින් තවාන් දැමීමේ ඉතා සාර්ථක ක්‍රමයක් ලෙස කොන්ක්‍රීට් තවාන් පාත්ති ක්‍රමවේදය හඳුනා ගන්නා ලදී. මෙම ක්‍රමයේදී බීජ පොල් පැළවීමේ ප්‍රතිශතය 80%කි. 2021 වර්ෂයෙදී එරමිණිගොල්ල තවානේ කොන්ක්‍රීට් තවාන් පාත්ති 02ක් සහ ඉබ්බාගමුව තවානේ කොන්ක්‍රීට් තවාන් පාත්ති 05ක් ස්ථාපිත කර ලදී. මෙම තවාන් පාත්ති ක්‍රමය මගින් බඳුන් මිශ්‍රණ සඳහා වැය වන මුදල අවම කර ගත හැකි අතර, අවශ්‍ය වන ජල ප්‍රමාණයද අඩුය.

2.2.2.4 කාබනික පොහොර නිෂ්පාදනය

බඳුන් පොල් පැළ නිෂ්පාදනයේදී බඳුන් මාධ්‍ය, පවතින වගාවන් වලට කාබනික පොහොර ලබා ගැනීමට සහ රසායනික පොහොර සඳහා වැයවන මුදල අවම කර ගැනීමේ අරමුණින් තවාන තුළ තිබෙන අමුද්‍රව්‍ය උපයෝගීකර ගනිමින් තවාන් 36ක් තුළම කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කරන ලදී. ඒ අනුව 2021 වර්ෂය තුළ, කාබනික පොහොර මෙට්‍රික් ටොන් 293ක් පමණ නිෂ්පාදනය කරන ලදී.

2.2.2.5 බඳුන් පොල් පැළ නිෂ්පාදනයට අවශ්‍ය බඳුන් මාධ්‍ය තවාන් තුළම නිපදවා ගැනීම

හෙට්ටිපොල සහ ඇඹිලිපිටිය තවාන්වලට ලබා දී ඇති මල්ටි ෆොපර් යන්ත්‍ර භාවිතා කරමින් පොල් ලෙලි කැබලි වලට කපා බඳුන් පැළ නිපදවීම සඳහා බඳුන් මාධ්‍ය ලෙස යොදාගැනීම මගින් බඳුන් මාධ්‍ය සඳහා වැයවන වියදම අවම කර ඇත.

2.2.2.6 නව ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම

a) ලබුදුව තවානේ අක්කර 01 පමණ පොල් පැළ තවාන සඳහා රුපියල් 124,940.00ක වියදමකින් යුතු විසුරුම් ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම.

b) කලාවැව තවානේ අක්කර 1.5ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි රුපියල් 33,000.00 ක වියදමින් විසුරුම් ජල සම්පාදන පද්ධතියක් ස්ථාපනය කිරීම.

2.2.2.7 <u>පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>

ව්‍යාප්ති අංශය මගින් පැවැත්වෙන පුහුණු වැඩසටහන් වලට සහයෝගය දැක්වීම පිණිස පල්ලෙකැලේ, මත්තමගොඩ, මැදමුලන, විල්පොත, ඇඹිලිපිටිය, කිරිමැටියාන, මහයාය, ඉඹ්බාගමුව යන තවාන්වල කෘෂිකර්ම ඩිප්ලෝමාධාරීන් පුහුණු කිරීම, විශ්ව විද්‍යාල සිසුන් පුහුණු කිරීම, ප්‍රජා තවාන් ආරම්භකිරීම සඳහා හමුදා නිලධාරීන් පුහුණු කිරීම හා පොල් වගාකරුවන් සඳහා පොල් වගාව පිළිබඳ පුහුණුව ලබාදීම සිදුකරන ලදී.

.

2.13 පලතුරු, අපනයන කෘෂිකර්ම බෝග පැළ නිෂ්පාදනය සහ අතුරු බෝග වගා කිරීම

	ප්‍රාදේශීය කාර්යාලයේ නම	තවානේ නම	පැළ වර්ගය								
			දෙකුණු	පේර	ඌරු ඇල	දෙඩම්	කොකෝ	අනෝදා	ලෙමන්	ගම්මිරිස්	රඹුටන්
1	අම්පාර	උහන	804	250	29	58					
2	ගම්පහ	කිරිදිවැල								1,000	
		වල්පිට								500	500
3	කෑගල්ල	පොල්ගහවෙල	500					350			
		මත්තමගොඩ								3,500	
4	කුරුණෑගල	ඉඹ්බාගමුව							100	3,000	
5	මොණරාගල	හඳපානගල					5,200				
6	රත්නපුර	ඇඹිලිපිටිය	250								
නිකුත් කරන ලද මුළු පැළ ගණන			***1,554***	***250***	***29***	***58***	***5,200***	***350***	***100***	***8,000***	***500***

2.3 මීගමුව - බීජ නිෂ්පාදන ඒකකය.

දිවයින පුරා වගාකිරීම සඳහා උසස් නිෂ්පාදන හැකියාවෙන් යුත්, උසස් තත්ත්වයේ පොල් පැළ වගාකරුවන් වෙත ලබාදීමේ අරමුණින් පොල් පර්යේෂණ ආයතනයේ අධීක්ෂණය සහිතව උසස් මව් ශාක තෝරා ලබාගන්නා බීජ පොල් සියලුම තවාන් හා ආදර්ශ පොල් උයන් වෙත ප්‍රවාහනය කර සැපයීම ප්‍රධාන කාර්ය වේ.

එයට අමතරව වාර්ෂික බීජ පොල් අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය ක්‍රමෝපාය සැලසුම් සකස් කිරීමට දායකත්වය ලබා දී එම සැලසුම් ක්‍රියාත්මක කිරීම, පොල් වගාකරුවන්ට අවශ්‍ය යෙදවුම් හා සැපයුම් සේවාවන් සඳහා පහසුකම් සැපයීම හා මෙහෙයවීමත් මෙම ඒකකය සතු අනෙකුත් කාර්යයන් වේ. මෙම සියලු කටයුතු සිදුකරනු ලබන්නේ බීජ නිෂ්පාදන ඒකකය විසින් වන අතර, ඒ සඳහා එම ඒකකය සතුව අවශ්‍ය යටිතල පහසුකම් සහ පලපුරුදු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයක් ද අනුයුක්තව සිටී.

2021.01.01 සිට 2021.12.31 දක්වා වසරේ යල සහ මහ කන්න වලදී මණ්ඩලයේ තවාන් හා ආදර්ශ පොල් උයන් වෙත සපයා ඇති සමස්ත බීජ පොල් ප්‍රමාණය 6,824,086කි. එම බීජ පොල් ප්‍රමාණයෙන් 2021 මහ කන්නයේ පැළ ලබා ගැනීම සඳහා බීජ පොල් 3,641,790ක් ද, 2022 යල කන්නයේ පැළ ලබා ගැනීම සඳහා බීජ පොල් 3,182,296ක් වශයෙන් සපයා ඇත.

3.0 පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය

පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය පොල් වගාකිරීමේ මණ්ඩලයේ සියලුම අංශ ඒකක සහ කාර්යාල සම්බන්ධීකරණය කරමින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කිරීමත්, අවශ්‍ය යටිතල පහසුකම් සම්පාදනය කරමින්, වැඩි දියුණු කරමින් මානව සම්පතෙහි ඵලදායිතාවය උපරිම කිරීම උදෙසා කටයුතු කරනු ලබයි. අදාළ කාල සීමාව තුළ දී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 12ක් පවත්වා ඇති අතර මණ්ඩලයේ කාර්ය මණ්ඩල ව්‍යුහය පහත සඳහන් කර සිටිමු.
කේ.එල්.එම්.සී. කුලරත්න මහත්මිය ද්විතීය පදනම මත 2020.11.05 වන දින සිට 2021.12.20 දින දක්වා සාමාන්‍යාධිකාරී තනතුරේ රාජකාරී කටයුතු සිදුකරන ලදී.

3.1 කාර්ය මණ්ඩල ව්‍යුහය

2021 වර්ෂය තුළදී මණ්ඩලයේ ඉලක්ක සපුරාගැනීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය දායක වී ඇත.

වගු අංක 3.1 2021 වර්ෂයේ කාර්ය මණ්ඩලය ප්‍රමාණය

ජේෂ්ඨ කළමනාකාර	02
කළමනාකාර	40
කනිෂ්ඨ කළමනාකාර	46
ක්‍රියාත්මක කිරීමේ/ උපදේශණ සේවා	0
කළමනාකරණ සහකාර (තාක්ෂණ)	242
කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	195
ප්‍රාථමික ශ්‍රේණිය(අර්ධ ශිල්පීය)	01
ප්‍රාථමික ශ්‍රේණිය (ශිල්පීය)	39
ප්‍රාථමික ශ්‍රේණිය (ශිල්පීය නොවන)	78
දැනට තනතුරු දරන්නාට පමණක් පෞද්ගලික වන සේ පවතින තනතුරු	03
වතුපාලන සේවයේ සේවකයින් (ස්ථිර)	101
කොන්ත්‍රාත්	01
චෙක්රෝල්	767
එකතුව	**1515**

3.2 බඳවා ගැනීම් සහ උසස් කිරීම්

මණ්ඩලයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව මෙම වසර තුල පුරප්පාඩුව පැවති තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2021 වසර තුළදී විධිමත් හා විනිවිද භාවයෙන් යුක්තව නව පත්වීම් සහ උසස්වීම් පහත වගුව පරිදි ලබාදී ඇත.

වගු අංක 3.2 2021 වර්ෂයේ නව බඳවා ගැනීම් හා උසස්වීම්

තනතුර	නව බඳවා ගැනීම්	උසස්වීම්
ප්‍රාදේශීය කළමනාකරු	02	02
කළමනාකරු (සැලසුම් හා මෙහෙයුම්)	-	01
කළමනාකරු (බීජ හා රෝපන)	01	-
ගිණුම් නිලධාරී	-	03
විෂයානුබද්ධ නිලධාරී (ශෂ්‍ය විද්‍යා මූලධර්ම සහ පාංශු සංරක්ෂණ)	-	01
පරිපාලන නිලධාරී	-	02
කාර්මික නිලධාරී	-	01
එකතුව	**03**	**10**

3.3 දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන්

2021 වර්ෂයේදී මණ්ඩලයේ විවිධ අංශවල සේවයේ නියුතු නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් දේශීය වශයෙන් පවත්වන ලද විවිධ සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු සහ උපාධි පාඨමාලා සඳහා 79 දෙනෙකු බාහිර ආයතන වෙත යොමුකර පුහුණු අවස්ථා සලසාදී ඇති අතර, මණ්ඩලයේ අනුග්‍රහය යටතේ විවිධ සම්පත් දායකත්වයන් තුලින් පොල් සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය සමග එක්ව නිලධාරීන් 131ක් දේශීය පුහුණු පාඨමාලා/ වැඩමුළු/ සම්මන්ත්‍රණ සඳහා යොමුකල අතර, රට තුළ සහ ගෝලීය වශයෙන් පැවති COVID -19 වෛරස් ව්‍යාප්තිය හේතුවෙන් විදේශ පුහුණු අවස්ථාවන් සලසාදීමට අවස්ථාවක් නොලැබී ඇත.

වගු අංක 3.3 දේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය

සාමූහික දේශීය පුහුණු සැසිවාරයන්	පුහුණු ලාභීන් සංඛ්‍යාව
1. සංචාරක බංගලා භාරකරුවන්ගේ ආකල්ප වර්ධනය හා ආගන්තුක සත්කාර	45
2. විධායක නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුව	60
3. විධායක නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව	59
එකතුව	**164**

3.4 එලදායිතාවය ප්‍රවර්ධනය

ජාතික එලදායිතා ලේකම් කාර්යාලය මගින් මෙහෙයවනු ලබන 2020-2021 වර්ෂයේ ජාතික එලදායිතා සම්මාන තරඟාවලිය සඳහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපත් වී විශිෂ්ඨ කුසලතා සම්මානයක් හිමිකරගන්නා ලදී.

3.5 මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ස්ථාපනය

මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ස්ථාපනය සඳහා වූ මූලික ක්‍රියාවලිය සහ ඒ සඳහා මණ්ඩලයේ සියලුම නිලධාරීන්ගේ දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාවලිය යන ක්‍රියාවලීන් අවසන් කරමින් අවසන් මට්ටමට ප්‍රවේශ වීම.

3.6 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ

මණ්ඩලයේ හා වතු පාලන සේවාවේ සේවයේ නියුතු නිලධාරීන් 213ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත පැවරීමට අනුව පැවති කෝරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද සියලුම දෙනාගේ කඩඉම් විභාගයන් පවත්වා අවසන් කරගැනීමට හැකි විය.

3.7 විශ්‍රාම ලබාගැනීම්

මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා තම හැකියාවන් හා දක්ෂතාවයන් කැපකරමින් කාර්යක්ෂමව මනා සේවාවක් ඉටුකර වයස අවු:60 සම්පූර්ණ වීම නිසා නිලධාරීන්/සේවකයින් 15 දෙනෙකු මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ලබා ඇත. මෙම නිලධාරීන්/ සේවකයන් හට හිමිවිය යුතු පාරිතෝෂික සහ අනෙකුත් ප්‍රතිලාභයන් නියමිත කාලයන් තුළදී නොපමාව ඔවුන් වෙත ලබාදීමට පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය අදාළ පියවර ගන්නා ලදී.

4.0 අභ්‍යන්තර විගණන අංශය

4.1 අභ්‍යන්තර විගණනයේ අරමුණ

පොල් වගාකිරීමේ මණ්ඩලය ළඟාකර ගැනීමට අපේක්ෂිත දැක්ම, මෙහෙවර, පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා සංවිධානයේ කටයුතු කර තිබේද යන්න සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය වර්ෂය පුරා කාර්යක්ෂමව හා ඵලදායීව තිබේද යන්න හා වත්කම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදමින් ප්‍රාදේශිය ඒකක අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යන්නේදැයි පිළිබඳව සිදුකරනු ලබන ඇගයීමකි.

4.2 මෙම වර්ෂය තුළ සිදුකරන ලද අභ්‍යන්තර විගණන පරීක්ෂණ

අභ්‍යන්තර විගණන විෂයපථයට අදාළ කාර්යභාරය හා රාජකාරී ඉතාමත් ගුණාත්මක තත්වයකින් අඛණ්ඩ පදනමක් මත 2021 වර්ෂය තුළ ඉටුකර ඇත.

1. ගර්ඩ්ලන්ඩ් ආදර්ශ පොල් උයන - විශේෂ විගණන පරීක්ෂණය.
2. කළුතර ප්‍රාදේශීය කාර්යාලය - වාර්ෂික විගණන කටයුතු.
3. කොරොස්දූව පොල් පැල තවාන - වාර්ෂික විගණන කටයුතු.
4. ප්‍රධාන කාර්යාලයේ මහජන බැංකුව- බත්තරමුල්ල ශාඛාවේ 975 සහ 971 ජංගම ගිණුම්වල බැංකු සැසඳුම් පරීක්ෂා කිරීමේ විශේෂ විගණන පරීක්ෂණය.
5. මහායාය ආදර්ශ පොල් උයනේ කැඩූ පොල් ගණනය කිරීමේ විශේෂ විගණන පරීක්ෂණය.
6. මාතලේ ප්‍රාදේශීය කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ දෙවන අදියර ඉදිකිරීම සම්බන්ධ විශේෂ විගණන පරීක්ෂණය.
7. වෙන්නෝරුව පොල් පැල තවාන - වාර්ෂික විගණන කටයුතු.

ඉහත සඳහන් ඒකක වල සිදුකරන ලද විගණන කටයුතුවලදී අනාවරණය වූ වැරදි හා අඩුපාඩු සභාපතිතුමා වෙත වාර්තාකර ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. තවද මෙම විගණන නිරීක්ෂණයන් හා පිළිතුරු විගණන හා කළමනාකරණ කමිටුවට ද ඉදිරිපත්කර එම කමිටු නිර්දේශයන් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත අවශ්‍ය තීරණ ගැනීම සඳහා ඉදිරිපත්කර ඇත.

4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

4.3.1 මෙහි අරමුණ

අභ්‍යන්තර හා බාහිර විගණන මගින් හෙලිදරව්වන වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළමනාකාරීත්වය වෙත මගපෙන්වීමක් සිදුකිරීම සහ මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීම විගණන කමිටු රැස්වීම් පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වේ.

මෙම වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

	පැවැත්වූ දිනය
❖ 2021/01 රැස්වීම	2021.04.29
❖ 2021/02 රැස්වීම	2021.10.13
❖ 2021/03 රැස්වීම	2021.11.30
❖ 2021/04 රැස්වීම	2021.12.28

4.3.2 කමිටු සංයුතිය

1. තරංගා ලියනගේ මහත්මිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වැ.බ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	සභාපති
2. ආර්.පී.කස්තුරිආරච්චි මහත්මිය අධ්‍යක්ෂ ජනරාල්, වැවිලි රාජ්‍ය අමාත්‍යාංශය	සාමාජික
3. වෛද්‍ය සී.එස්.ක්‍රිෂාන්ත මහතා අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික	සාමාජික
4. ඒ.පොඩිරාළහාමි මහතා අභ්‍යන්තර විගණක වැවිලි රාජ්‍ය අමාත්‍යාංශය	නිරීක්ෂක
5. ආර්.එම්.එම්.එස්.පෙරේරා මහත්මිය (විගණනාධිකාරී)	නිරීක්ෂක
6. කේ.එල්.මානෙල් කුලරත්න මහත්මිය සාමාන්‍යාධිකාරී පොල් වගාකිරීමේ මණ්ඩලය	ලේකම්/කැඳවුම්කරු
7. බී.ඒ.ඩබ්.බමුණුආරච්චි මහතා (පොල් වගාකිරීමේ මණ්ඩලය)	අභ්‍යන්තර විගණක

අභ්‍යන්තර විගණන පරීක්ෂණ වලින් හෙලිදරවිවන වැරදි අඩුපාඩු හා රජයේ විගණන අංශයේ විගණන විමසුම් ද විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කර අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.

5.0 මූල්‍ය කළමනාකරණ අංශය

5.1 ගිණුම් ප්‍රකාශය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ සමස්ථ කාර්යයන් 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ විධිවිධානයන්ට අනුකූලව, නියමිත චක්‍රලේඛ මුදල් රෙගුලාසිවලට යටත්ව ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව 2021.12.31 දිනෙන් අවසන් වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

දීප ව්‍යාප්තව ප්‍රාදේශීය කාර්යාල 19ක් ද පුහුණු මධ්‍යස්ථාන 3ක් ද සහිත සම්බන්ධීකරණ ජාලයක් තුළ තවාන් 39කින් සහ ආදර්ශ පොල් උයන් 12කින් සපුරාගත යුතු ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ද ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතීන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට උචිතවන්නාවූ මූල්‍ය ඇස්තමේන්තු සකස් කිරීම, සැලසුම් කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීම, ලේඛනගත කිරීම වාර්තා කිරීම හා පුරෝකථනය කිරීම මූල්‍ය කළමනාකරණ අංශයේ ප්‍රමුඛ ක්‍රියාදාමයයි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ)ගේ මෙහෙයවීම හා මගපෙන්වීම යටතේ මූල්‍ය කළමනාකරණ අංශයේ සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ), ගණකාධිකාරී (මූල්‍ය), ගණකාධිකාරී (ආදර්ශ පොල් උයන්), ගිණුම් නිලධාරී වශයෙන් හා සහායක කාර්යමණ්ඩලය දීප ව්‍යාප්තව ප්‍රාදේශීය කාර්යාල තුළ මූල්‍ය කටයුතු මෙහෙය වීම, වාර්තා කිරීම හා පාලනය කිරීම සිදුකරනු ලබයි.

2021 වර්ෂයේ මණ්ඩලයේ ඇස්තමේන්තුවලට අදාළව පුනරාවර්ථන වැය ශීර්ෂය යටතේ රු.මිලියන 500ක් සහ ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ රු. මිලියන 734.294ක් මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන ලබාදී ඇත.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙනුවෙන් පොල් වගාව නඟාසිටුවීම සඳහා වූ ව්‍යාපෘතිය පවත්වා ගෙනයාමට පොල් වගාකිරීමේ මණ්ඩලය කටයුතු කරයි. ඒ අනුව වැලිගම පොල් කොළ මැළවීම හා කුණුවීමේ මර්දන වැඩසටහන සඳහා රු. මිලියන 17.72ක් ද, මයිටා ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 10ක් ද වශයෙන් ප්‍රතිපාදන පොල් වගාකිරීමේ මණ්ඩලයට ලබාදී ඇත.

ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන් තුළ ව්‍යාප්ත පොල් වගාව සම්බන්ධයෙන් පැතිර ඇති කොළ මැළවීමේ රෝගය මර්දනය කිරීමට හා මැඩ පැවැත්වීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලබාදෙන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 18.20ක මුදලක් වැයකරන ලදී. එය පිළිවෙලින් ගාල්ල දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන 1.49ක් ද, මාතර දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන 15.05ක් ද , හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන 1.66කි. මෙම රෝග මර්දනයට හා පැතිරීම වැළැක්වීමට පොල් වගාකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම පමණක් නොව නව ව්‍යාපෘතිය හා සංවර්ධන කටයුතු මගින් විශාල පිටුවහලක් වගාකරුවන් වෙත ලබාදී ඇත.

ස්වයං මූල්‍ය ඒකකය යටතේ 2021.12.31 දිනට තවාන් හා සංවර්ධන අංශය රු. මිලියන 26.924ක අතිරික්තයක් ද ආදර්ශ පොල් උයන් මගින් රු. මිලියන242.987ක අතිරික්තයක් ද උපයා ඇත. පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2021 වර්ෂය තුළ සමස්ථ මෙහෙයුම්වලට අදාළව රු. මිලියන 71.92ක විවිධ

ආදායමක් උපයා ගැනීමට හැකි වී තිබේ. එසේම 2021.12.31 දිනට සමස්ත අතිරික්තය රු. මිලියන 611.133කි.

2021 වර්ෂය තුළ දරන ලද පුනරාවර්ථන වියදම රු. මිලියන 587.223ක් වූ අතර, පොල් ක්ෂේත්‍රයේ ව්‍යාප්ති හා සංවර්ධන සේවාව වෙනුවෙන් පොල් වගාකරුවන්ට සංවර්ධන වැඩසටහන් හා සහනාධාර ලෙස රු. මිලියන 507.54 ක් හා ප්‍රාග්ධන හා ඉදිකිරීම් හා මිලදී ගැනීම සඳහා රු. මිලියන 55.292ක් වැය කොට ඇත. ඒ අනුව මණ්ඩලය සතු වත්කම් වල සමස්ත වටිනාකම රු. මිලියන 3,337,865 කි.

Coconut Cultivation Board

Statement of Financial Position for the Year Ended as at 31st December 2021

	Note	2021 Rs.	2021 Rs.	2020 Rs.	2020 Rs.
ASSETS					
Non- Current Assets					
Property, Plant and Equipment	02	874,280,675.34		817,326,105.41	
Work In Progress	03	52,204,748.92		42,436,413.10	
Investment (LT)	04	79,563,888.09		5,345,358.01	
Kapruka Refinance Investment (LT)	04	1,183,338,258.12		1,013,194,605.64	
Biological Assets(Differed Expenditu	05	365,711,768.44		359,988,831.56	
Biological Stock	06	34,168,190.00	**2,589,267,529**	35,328,455.54	**2,273,619,769**
Leased Land	07	5,026,617.67	**5,026,618**	**5,173,466.56**	**5,173,467**
Current Assets					
Inventories / Stocks	08	776,466,398.11		273,215,198.16	
Trade and other Receivables	09	76,847,285.02		65,121,932.64	
Prepayments	10	112,580.22		949,714.60	
Deposits (ST)	11	3,516,257.36		3,300,007.36	
Investment (ST)	12	-		47,850,286.01	
Cash and Cash Equivalents	13	518,932,909.22		326,310,064.00	
Account Current (M/G)	14	(19,026,011.94)		(29,990,706.00)	
Account Current (Nursery)	14	4,675,275.23		4,675,275.00	
Account Current SPU	14	1,703,686.32			
			1,363,228,380	-	**691,431,772**
			3,957,522,526		**2,970,225,007**
Total Assets					
LESS: LIABILITIES					
Current Liabilities					
Payable	15	328,986,297.60		129,063,831.47	
Accrued Expenses	16	19,984,402.90		25,608,284.10	
Short -term Provision	17	35,863,513.00		36,313,371.86	
		384,834,213.50		**190,985,487.43**	
Non-current liabilities					
Long Term Provision	17	234,823,042.73		223,627,040.99	
		234,823,042.73		**223,627,040.99**	
Total liabilities			**619,657,256**		**414,612,528**
Total Net Assets			**3,337,865,270**		**2,555,612,479**
NET ASSETS/EQUITY					
Accumulated Fund					
Capital Fund	18	398,627,658.49		378,615,051.22	
General Fund	19	1,581,596,187.17		971,250,903.00	
Capital Fund(Kapruka)	20	954,250,260.07		852,588,425.76	
Cr. Grant. Fund (Kapruka)	21	161,957,065.84	**3,096,431,172**	111,724,000.40	**2,314,178,380**
Reserves					
Capital Reserves	22	68,192,460.98		68,192,460.98	
Revenue Reserves (C.M.G)	23	173,241,637.39	**241,434,098**	173,241,637.39	**241,434,098**
Total Net Assets /Equity			**3,337,865,270**		**2,555,612,479**

The Accounting Policies and Notes on Page Nos. 1 to 45 are integral part of these Financial Statements.The board of Directors is responsible for the preparation and presantation of these Financial Statements.

G.D.T.S. Perera
Deputy General Manager
Finance Management
Coconut Cultivation Board

W.M.B.A. Wijesinghe
General Manager
Coconut Cultivation Board

D.S. Wijesekara
Additional Secretary
Coconut, Kithul & Palmirah Dev.Division
Ministry of Plantation Industries
Board of of Director
Coconut Cultivation Board

A.V.K. Madhavie Herath
Chairman
Coconut Cultivation Board

Coconut Cultivation Board
Statement of Financial Performance for the Year Ended
31 st DECEMBER 2021

	Note	2021 Rs.	2021 Rs.	2020 Rs.	2020 Rs.
Operating Revenue					
Government Recurrent Grant		500,000,000		479,000,000	
Government Capital Grant		679,002,363		692,827,236	
Ministry of Plantation Industries - Weligama Wilt		17,720,440		18,701,522	
Ministry of Plantation Industries - Barren Paddy Field		17,690,000		-	
Ministry of Plantation Industries - Wawilisaviya		-		1,000,000	
Ministry of Plantation Industries - Irrigation Project		259,350,000			
Ministry of Plantation Industries - Mite Project		10,000,000		5,000,000	
Min. of Plts - Impr. of coconut land Prod. Prject		100,000,000			
Coconut Development Authority - King Coconut		-		25,000,000	
Total of Revenue (A)			**1,583,762,803**		**1,221,528,757**
Other Income					
Profit on Nursary Unit	**24**	76,419,724		(48,230,434)	
Negambo seed Unit	**24**	(49,495,510)		(38,473,531)	
Sundry Income	**25**	71,919,794		42,057,409	
Profit on Disposal Account	**26**	39,722		-	
Profit on Model Garden Unit	**27**	242,835,000		42,285,178	
Training Center Income	**29-2**	946,422		-	
Circuit Bungalow (CMG L- Note 27 & G/L 31)	**31**	(969,777)		(2,633,822)	
Kapruka Project Income	**30**	38,129,208		-	
Mite Project	**32**	2,063,419		(405,406)	
Iotal Income of Self Finance (B)			**381,888,001**		**(5,400,607)**
Grand Total (A+B)			**1,965,650,804**		**1,216,128,150**
Less: Development Programme expenses - 2021	**28**		**767,293,641**		**507,547,074**
			1,198,357,163		**708,581,075**
Less :Operating Expenses					
Personal Emoluments	**29**	367,137,692		376,346,485	
Traveling & Subsistence	**29**	4,087,198		3,479,014	
Supplies and Consumable used	**29**	20,702,361		15,052,976	
Maintenance	**29**	38,972,982		25,861,030	
Contractual Services	**29**	27,605,161		19,790,886	
Depreciation and Amortization Expenses	**29**	49,554,469		67,122,133	
Other Recurrent Expenditure	**29**	50,164,195		69,458,523	
Training Center Expendiute	**29-2**	15,991,975		-	
Kapruka Ayojana Expenditure	**30**	13,007,361		-	
Total Operating Expenses			**587,223,394**		**577,111,046**
Surplus/(Deficit) from operating activities - 2021			**611,133,768.66**		**131,470,029**

Coconut Cultivation Board

CONSOLIDATED CASH FLOW STATEMENT FOR THE YEAR ENDED

31 st DECEMBER 2021

	Note		2021 Rs		2020 Rs
Cash Flows from Operating Activities					
Surplus /(deficit) from ordinary activities			**611,133,769**		**131,470,030**
Adjustment for Item not Involving Movement of Cash					
Depreciation of the Year		45,966,921		64,287,029	
Provision for Gratuity		29,585,490		43,439,544	
Provision for Audit Fees		552,600		552,600	
Interest Income		(2,868,780)		(1,043,084)	
Mature Plant Depreciation of the Year		8,584,891		7,596,535	
Write-off Lease Land		146,849		146,849	
Write-off Capital Depreciation of the Year		(35,279,029)		(32,179,765)	
Provision for cash handling allowane		1,651,933		1,318,391	
Provision for L.R.C. Tax		275,000		274,999	
			48,615,874		**84,393,098**
			659,749,643		**215,863,128**
Prior Period Items General Ledger (not 18)		(788,484)		(21,469,614)	
Capital fund		-		(2,921,704)	
Kapruka Ledger		29,648,462	**28,859,978**	4,055,831	**(20,335,487)**
Adjustment - Kapruka Fund					
Operational Account Kapruka Surplus (Deficit)	Note 30	-		(7,262,076)	
Interest Income		(37,803,654)		(36,296,721)	
Credit Guaranty Fund (Kapruka)		2,479,412	**(35,324,242)**	1,714,979	**(41,843,819)**
Operating Profit of Working Capital			**653,285,379**		**153,683,823**
Change in Items of Working Capital					
Stocks (Increase) / Decrease		(502,090,934)		235,637,405	
Debtors (Increase) / Decrease		(11,725,352)		44,507,834	
Deposit (Increase) / Decrease		(216,250)		(25,000)	
Current Account (Increase) / Decrease		(12,668,381)		(7,707,340)	
Investment (Increase) / Decrease		(26,368,244)		(20,089,769)	
Prepayment (Increase) Decrease		837,134		(410,328)	
Creditors Increase/ (Decrease)		199,922,466		(64,582,149)	
Accrued Expenses Increase / (Decrease)		(5,623,881)	**(357,933,442)**	(25,914,781)	**161,415,872**
Net Cash Generated from Operating Activities			**295,351,936**		**315,099,695**
Cash Flows from Investing Activities					
Purchase of Fixed Assets (Increase)		(111,506,381)		(224,034,986)	
Mature Planation	Note 01	49,417,807		37,829,085	
Pallai Irrigation (02lakes)	Note 02	-		11,756,760	
Payment for Lease Land		-		-	
Investment Long Term - Decrease (Increase)		(170,143,652)		(82,080,369)	
Interest Income Received		40,672,434		37,339,806	
Deferred Expenditure		(55,140,744)		(62,341,910)	
Working Progress		(9,768,336)	**(256,468,873)**	131,675,677	**(149,855,938)**
Net cash Used in investing activities			**38,883,064**		**165,243,756**
Cash Flows from Financing Activities					
Capital Grant /Treasury (Kapruka)		66,847,025		78,752,398	
Capital Grant /Treasury		55,291,637		28,420,367	
Special Project Ministry grant		52,920,000		-	
		175,058,662		107,172,765	
Used in cash activities					
Cash handling allowance paid		(1,318,391)		-	
Paid Audit fee		(1,611,000)			
Gratuity Paid		(18,389,489)			
		(21,318,880)	**153,739,783**	(24,066,114)	**83,106,651**
			192,622,846		**248,350,407**
Net Cash Generate from financing activities					
Net increase/(decrease) in cash and Cash Equivalents		192,622,845			248,350,407
Cash and cash equivalents at beginning of the Year		326,310,064			77,959,657
Cash and cash equivalents at end of the Year		**518,932,909**			**326,310,064**

Coconut Cultivation Board
STATEMENT OF CHANGES IN NET ASSETS FOR THE YEAR ENDED
As at 31 st DECEMBER 2021

Rs.

	Notes	Accumulated Fund	Accumulated reserve	Translation reserve	Total
Balance at 31st December 2019		2,133,597,935	241,434,098	-	**2,375,032,033**
Changes in accounting policy		-	-		-
Adjustment balance		-	-		
		2,133,597,935	**241,434,098**	-	**2,375,032,033**
Surplus on revaluation of properties		-	-	-	-
Deficit on revaluation of investments		-	-	-	-
Currency translation differences		-	-	-	-
		2,133,597,935	**241,434,098**	-	**2,375,032,033**
Net gains and losses not recognized in the statement of financial performance					
Increase of capital fund	18	(6,681,102)			(6,681,102)
Prior year adjustment account	19	(21,469,614)			(21,469,614)
Surplus/(Deficit) for the period	19	131,470,030			131,470,030
Increase fo capital fund (Kapruka)	20	49,134,801			49,134,801
Increase of credit Guarantee fund (Kapruka)	21	28,126,330			28,126,330
Balance as at 31st December 2020		**2,314,178,380**	**241,434,098**	-	**2,555,612,478**
Deficit on revaluation of properties		-	-	-	-
Surplus on revaluation of investments		-	-	-	-
Currency translation difference		-	-	-	-
		2,314,178,380	**241,434,098**	-	**2,555,612,479**
Net gains and losses not recognized in the statement of financial performance					
Increase of capital fund	18	20,012,607	-	-	20,012,607
Prior year adjustment account	19	(788,484)	-	-	(788,484)
Surplus/(Deficit) for the period	19	611,133,769	-	-	611,133,769
Increase fo capital fund (Kapruka)	20	101,661,834	-	-	101,661,834
Increase of credit Guarantee fund (Kapruka)	21	50,233,065	-	-	50,233,065
Balance as at 31st December 2021		**3,096,431,171**	**241,434,098**	-	**3,337,865,270**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PAL/F/CCB/01/2021/14

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූලි 17 දින

COCONUT CULTIVATION BOARD
712
19 JUL 2023
CHAIRMAN DIVISION
Received Date

සභාපති

පොල් වගාකිරීමේ මණ්ඩලය

පොල් වගාකිරීමේ මණ්ඩලය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කර ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : - (1) ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

(2) ලේකම් - වැවිලි කාර්මාන්ත අමාත්‍යාංශය

GM/CCB
For your information & necessary action

.....
Chairman/CCB

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	PAL/F/CCB/01/2021/14	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2023 ජූලි 17 දින

සභාපති
පොල් වගාකිරීමේ මණ්ඩලය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනසහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 24 (අ) ඡේදය ප්‍රකාරව අස්තිත්වයන් විසින් අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යාවන් වෙන වෙනම නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අයවැය ගත සංඛ්‍යාවන්දක්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 76 (ඇ) ඡේදය ප්‍රකාර ජංගම වත්කම් යටතේ දැක්විය යුතු 2021 දෙසැම්බර් 31 දිනට මාස 06න් කල් පිරෙන රු.14,083,793 ක ස්ථාවර තැන්පතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දිගුකාලීන ආයෝජන ලෙස දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 හි 9 ඡේදයට පටහැනිව පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2021 දෙසැම්බර් 31 දිනට මාස 03න් කල් පිරෙන එකතුව රු.79,826,734ක කෙටි කාලීන ස්ථාවර තැන්පතු හා රු.1,119,430,841ක ඉතුරු කිරීමේ ගිණුම් ශේෂ මුදල් සහ මුදල් හා මුදල් සමාන දෑ යටතේ පෙන්වීම වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 2 ට පටහැනිව මණ්ඩලයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ලාභයට සිදුකරන ගැලපීම් තුළ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ඇතුළත් රු.28,859,978 ක පෙර වර්ෂයේ ගැළපීමක් ද සිදුකර තිබුණි.

(ඉ) 2021 වර්ෂයේදී ගෙවූ විගණන ගාස්තුව රු.552,600ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.1,611,000 ක් ලෙස රු.1,058,400 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී මුදලින් මිලදිගත් දේපළ පිරියත හා උපකරණවල වටිනාකම රු.117,397,591 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දී එම අගය රු.111,506,381 ක් ලෙස සටහන් කර තිබුණු බැවින් ආයෝජන ක්‍රියාකරකම් තුළින් ලද මුදල් ප්‍රවාහය රු.5,891,210 කින් වැඩි වී තිබුණි.

(උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයන්ට අදාළව කාරක ප්‍රාග්ධනය ගැලපීම් සිදු කිරීමේදී තොග අගයන්හි වෙනස රු.503,251,200 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.502,090,934 ක් ලෙස රු.1,160,266 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණයෙන්ක්ෂයකර තිබුණු පිරිවැය රු.424,474,271 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනද ඒ අනුව ඇති වූ ඇස්තමෙන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරවගැලපුම් කර ගිණුම් ගතකර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 12 ඡේදයට අනුව ලැබෙන සියලු ආදායම්, අයභාරය ලෙස හඳුනා ගත යුතු වුවත් 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.734,294,000 ක ප්‍රාග්ධන ප්‍රදානයමූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ රු.679,002,363 ක් ලෙස රු.55,291,637 ක් අඩුවෙන් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

(ඒ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 2 වන ඡේදය ප්‍රකාරව ජෛව වත්කම් සහ අස්වනු නෙළන අවස්ථාවේදී වන කෘෂිකාර්මික නිෂ්පාදන මෙම ප්‍රමිතිය යටතේ ජෛව වත්කම් ලෙස හඳුනාගත හැකි වුවත් 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ නිරූපණය කර ඇති රු.365,711,768ක ජීව විද්‍යාත්මක වත්කම් වටිනාකම තුළ ඊට අදාළ නොවන සම්පූර්ණයෙන්ම අක්‍රියව පවතින ජීව වායු ව්‍යාපෘතියට අදාළ රු.300,374 ක පිරිවැය හා පලෙයි ඉඩම් සංවර්ධන වැඩසටහන සඳහා දරන ලද රු.74,610,392 ක වටිනාකම් ද ඇතුළත් කර තිබුණි.

(ඔ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 18 හි 13 වන ඡේදය අනුව ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස හඳුනා ගත හැකි ආදර්ශ උයන් 12 හි කොස්, තේක්ක ආදී වර්ග 51කදැවමය වටිනාකමක් සහිත ගස් 8916ක් හා තවාන් 39 හි වර්ග 64ක දැවමය වටිනාකමක් සහිත ගස් 6,577ක් වශයෙන් එකතුව ගස් 15,493ක් ද ආදර්ශ පොල් උයන් 12 හි පොල් ගස් 128,601ක් සහ තවාන් 39ක පොල් ගස් 8,473ක් ලෙස එකතුව පොල් ගස් 137,074ක් ද භෞතික සමීක්ෂණයෙන් හඳුනාගෙන තිබුණද එම ගස්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය හා ආදර්ශ පොල් උයන් අතර සිදු වන ගනුදෙනු වෙනුවෙන් පවත්වාගෙනයන අන්තර් ජංගම ගිණුම්වල වර්ෂ ගණනාවක සිට තුළනය නොවූ ශේෂ ඉදිරියට ගෙන එමින්පැවති අතර ඒ අනුව නිරවුල් නොවූ ගනුදෙනු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේආදර්ශ පොල් උයන් 06 ක එකතුව රු.31,348,289ක හර ශේෂයක්ද, පොල් උයන් 06 කඑකතුව රු.50.374.300ක බැර ශේෂයක් ද පැවති අතර එම හර හා බැර ශේෂයන් එකිනෙකට හිලව් කිරීමෙන් අනතුරුව ආදර්ශපොල් උයන්වලට ගෙවිය යුතු රු.19,026,011ක් ජංගම වත්කම් යටතේ බැර ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.

(ආ) පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් තවාන් 39 කට ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රාදේශීය කාර්යාල හරහා මාසිකව ලබාදෙන මුදල්වලින් එම තවාන්වල සියලු දෛනික වියදම් දැරීමෙන් අනතුරුව වර්ෂය අවසානයේදී ඉතිරි මුදල් ප්‍රධාන කාර්යාලයට ආපසු යැවීමෙන් පසුව තවාන් ලෙජර ගිණුම තුළනය නොවීම නිසා වසර ගණනාවක සිටම තවාන් ලෙජර ගිණුමෙහි ඉදිරියට ගෙන ආ හර හා බැර ශේෂයන් පැවති අතර 2021 වර්ෂය අවසානයට එම හර හා බැර ශේෂවල වෙනස රු.4,675,275 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය විසින් මීගමුව බීජ පොල් ඒකකය වෙත බීජ පොල් ප්‍රවාහනය, බීජ පොල් ඒකකයේ ඉන්ධන වියදම්,වාහන නඩත්තු වියදම් ආදී දෛනික වියදම් දැරීම සඳහා ලබා දෙන මුදල් වර්ෂය අවසානයේ තුළනය කර ගැනීමෙන් තොරව, සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.1,703,686ක හර ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලයට අයිති මාතර වැලිගම පිහිටි අක්කර 15 ක ඉඩමක් "පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගයට ඔරොත්තුදෙන ප්‍රතිරෝධී බීජ උද්‍යානයක් " ඉදිකිරීම සඳහා පොල් පර්යේෂණ ආයතනයට බදු දී තිබුණි. ඒ සඳහා 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලැබිය යුතු බදු කුලිය එකතුව රු.1,125,000 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය වී නොතිබුණු අතර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කිරීමද සිදු කර නොතිබුණි.

(ඉ) පාසිකුඩා සංචාරක ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂයන්හි දරන ලද රු.22,197,339ක පුනරාවර්තන වියදම ආදර්ශ පොල් උයන් යටතේ දිගුකාලීන ආයෝජන ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් දිගුකාලීන ආයෝජන වටිනාකම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2021 වර්ෂය සඳහා කප්රුක ව්‍යාපෘතියේ ආයෝජනයන් මත ලැබුණු ස්ථාවර තැන්පතු පොලී රු.1,996,293 ක් සහ 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.546,630ක් වශයෙන් මුළු පොලී ආදායම රු.2,542,923 ක් වුවද කප්රුක ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පොලී ආදායම රු.2,988,370 ක් ලෙස දක්වා ඇති බැවින් පොලී ආදායම රු.445,447 කින් වැඩිපුර ගිණුම්ගත වී තිබුණි.

(උ) පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් අක්කර 331 රූඩ් 01 ක් වූ මහයාය චත්ත ඉඩම 1993 ජූලි 21 දින ආයතනය වෙත පවරා දී තිබුණු අතර එහි වටිනාකම රු.7,813,048 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද පෙන්වා තිබුණි. ඒ අනුව පර්. 01ක වටිනාකම රු.147ක් වැනි අඩු අගයක් ගත්තද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ඉඩමේ නිවැරදි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආදායම්) ගේ 2021 මැයි 20 දිනැති ලිපිය පරිදි 1974 සිට 2022 වර්ෂය දක්වා මඩකලපුව, පාසිකුඩා වත්ත, කුරුණෑගල හාවානීල වත්ත හා ගර්ට්ලන්ඩ් වත්ත යන පොල් උයන් 3ක පරිහරණ ගාස්තු ලෙස රු.156,928,599 ක් එම සභාවට ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ ගෙවීම් සිදුකර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වෙන් කිරීමක් හෝ හෙළිදරව් කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඵ) සමාලෝචිත වර්ෂයේ පොල් වගාකිරීමේ මණ්ඩලයේ පොල් අලෙවි ආදායම රු.2,095,743 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණු අතර ලේනව ආදර්ශ පොල් උයනේ ලැබිය යුතු පොල් වෙන්දේසි ආදායම වූ රු.134,313 ක් දෙවරක් ආදායමට එකතු වී තිබුණි.

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) හිටපු සාමාන්‍යාධිකාරී වෙත වැඩිපුර වැටුප් ගෙවීම මත පොල් වගාකිරීමේ මණ්ඩලයට ලැබිය යුතු එකතුව රු.113,216ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) 2013 හා 2014 වර්ෂයන්හි පැවැත්වූ වැලිගම රෝග ව්‍යාප්ති වැඩසටහන හා කාබනික පොහොර වැඩසටහන සඳහා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.6,573,572ක් ද 2014 වර්ෂයේ ලංකා සතොසට පොල් විකිණීමෙන් ලැබිය යුතු රු.302,288ක් ද ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.372,537ක් ද වශයෙන් එකතුව රු.7,248,397ක් වසර 07කට වඩා වැඩි කාලයක සිට අයකර අයකරගෙන නොතිබුණි.

(ඇ) සේවය හැරගිය සේවකයින් 100 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1.654.349ක ණය මුදලක් වසර 02ත් වසර 11ත් අතර කාලයක සිට හිඟහිට තිබුණු අතර එම ණය අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) වසර 02 ත් 07 ත් අතර කාලයක සිට නිරවුල් නොවී පැවති ඉදිකිරීම් කාර්යයක් 42කට අදාළ රඳවාගත් මුදල් රු.6,565,730ක් අදාළ කාර්යයන් පිළිබඳ ඇගයීමක් කර නිරවුල් කර ගැනීමට කටයුතු නොකර වෙළෙඳ ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ඉ) ගබඩාකරු හා මුදල් අයකැමි වශයෙන් සේවය කර දැනට සේවයෙන් ඉවත් වී ඇති සේවකයින් 08 දෙනෙකුගෙන් 1979 සිට 1992 දක්වා කාලපරිච්ඡේදයක් තුළ ලබාගෙන ඇති එකතුව රු.603,818 ක තැන්පතු ශේෂයන් සඳහා වසර 29 සිට වසර 42 දක්වා කාලයක් ගත වුවද මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 1997 හා 1999 වර්ෂයන්හි මණ්ඩලයේ පොල් මිලදී ගත් පෞද්ගලික සමාගම් දෙකකින් අයවිය යුතු රු.3,808,156 ක් අය කර ගැනීමට නඩු පවරා තිබුණු නමුත් එම නඩු නිසි පරිදි මෙහෙයවා නොනිබීමෙන් වසර 23 ක් හා 24 ක කාලයක සිට එම මුදල් අය කර ගැනීමට නොහැකි

වී තිබුණි.මෙයින් රු.2,631,781 ක මුදලක් අයවිය යුතු ඩබ්ලිව්. ටී. වාස් සහ සමාගම සොයාගත නොහැකි බව දන්වා 2017 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුව අවසන් කර තිබුණු නමුත් එම සමාගම 2020 වර්ෂයේ තැරැව්කාර සමාගමක් ලෙස පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී පොල් වෙන්දේසි සඳහා සහභාගී වන බවද නිරීක්ෂණය විය.

(උ) විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණු නිලධාරීන් 11කට අදාළ රු.671,228 ක 2020 වර්ෂයේ නොගෙවූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද , ගෙවීම් කර නොතිබුණි.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) මහනුවර පත්තිනි දේවාලයට අයත් බදු ඔප්පුවක් මඟින් මණ්ඩලයට පවරා දී තිබුණු අක්කර 121 රූඩ් 01 පර්.07 ක රන්දෙණිය වත්තේ හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ලේනව වත්තේ රු.1,255,020ක මැනුම් ගාස්තු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණු නමුත් එම වටිනාකම සනාථ කිරීමට අවශ්‍ය ඉඩමේ සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ගිණුම් 17කට අදාළ රු.55,783,581ක ශේෂ සඳහා ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2021 මැයි මස 13 දින සිට දෙසැම්බර් 23 දක්වා අවස්ථා 33 කදී පොල් වගාකිරීමේ මණ්ඩලය පොල් සංවර්ධන අධිකාරියේ පොල් අලෙවි කිරීමේ වෙන්දේසියට පොල් වතු 8ක පොල් ගෙඩි 2,588,795ක් ඉදිරිපත්කර, ගැනුම්කරුවන් 6ක් වෙත රු.146,437,679 ක් වටිනා පොල් අලෙවියක් සිදු කර තිබුණි. එහිදී ලොට් අංක, මුර අංක, ඒකක මිල, මුළු වටිනාකම, දඩ මුදල් හෝ වෙනත් අඩුකිරීම් පිළිබඳව ගැනුම්කරුවා දැනුවත් කරන ඉන්වොයිසියක් නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී අදාළ ගැනුම්කරුවන් වෙත ඉන්වොයිස් නිකුත් කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි,මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ,ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැළපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහවංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මකසාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලයඅඛණ්ඩවපවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරීක්ෂා කිරීමේවගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා මණ්ඩලය තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම් කොටසේ 1.2.1 (ඇ) (ඉ) (ඊ) (උ) (එ) (ඒ) හා 1.2.2 (ඊ) (උ) (ඌ) (එ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතිකවිගණනපනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 12 (2) උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සකස් කර 2009 ඔක්තෝම්බර් 14 දිනැති අංක 1623/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරනු ලැබ ඇති නියෝග මාලාවේ 4 වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ සභාපති විසින් නිකුත් කර ඇති විධාන	රෝගී ගසක් ලෙස සලකුණු කළ දිනයේ සිට දින 14ක් ඇතුළත එම ගස් කපා ඉවත් කිරීම හා නියෝග කරනු ලබන ආකාරයට ක්‍රියා කිරීම කළ යුතු වුවද වැලිගම පොල් කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගයට ගොදුරු වූ ගස් ලෙස හඳුනාගෙන මණ්ඩලය සලකුණු කළ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉඩම් හිමිකරුවන් හෝ මණ්ඩලය විසින් කපා ඉවත් නොකළ පොල් ගස් ප්‍රමාණය 13.484 ක් විය.

(ආ)	2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය	ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 02 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.
(ඇ)	2014 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි පනවා ඇති පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසි නීතිමාලාව (i) 21 (අ), (ආ), (ඇ) සහ 22 (ඇ) නීතිය	පොල් වෙන්දේසියේදී පොල් තොග මිලදී ගැනීමෙන් දින 14 ක් ඇතුළත සියයට 25 ක් ද , දින 35 ක් ඇතුළත සියයට 75 ක් ද වශයෙන්ගැනුම්කරුවිසින් මුළු මුදලම ගෙවිය යුතු අතර එසේ නොවූ විටප්‍රමාද ගාස්තුවක් සහ සියයට 20ක බිම් කුලිය සඳහා ගෙවිය යුතු දඩ මුදලක් ද අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, විකුණුම් සඳහා ඉන්වොයිසියක් නිකුත් නොකරන බැවින් අදාළ දඩ මුදල් හා ප්‍රමාද ගාස්තු නියමාකාරයෙන් අයකරගත් බවට විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2012 වර්ෂයේදී අනුරාධපුර කටුකැලියාවේ සංචාරක බංගලාවේ ඉදිකිරීම් පෞද්ගලික කොන්ත්‍රාත්ආයතනයක් මගින් සිදුකර තිබුණු අතර කොන්ත්‍රාත් පිරිවැය රු.11,809,918 ක් විය. ඉදිකිරීම් අවසන්කර වසර 04ක් වැනි කෙටිකාලයක් ඇතුළත ගොඩනැගිල්ලේ පහත මාලයේ ඉරිතැලීම් 22ක්. පහත මහළයේ කාමරයක් තුළ බිම ඇතිරූ ගඩොල් සමඟ බිත්ති පිපිරීම් හා උඩුමහලේ ඉරිතැලීම් 06 ක් ද ඇති වී හානිදායක මෙන්ම අවධානම් තත්ත්වයකට පත් වී තිබුණු අතර ගොඩනැගිල්ලේ අත්තිවාරම සැලසුම් කිරීමේදී එම භූමියේ පවතින පසෙහි ස්වභාවය හා භූගත ජල මට්ටම ගැන සැලකිලිමත් වී නොමැති වීම ද, ඉදිකිරීම් නිසි ප්‍රමිතියකට සිදු වී නොමැති වීමද මෙම තත්වයට හේතුවී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.3. වෙනත් කරුණු

(අ) 2021 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පොල් ඉඩම්වල වාරිමාර්ග පද්ධති පිහිටුවීම හා මයිටා මර්ධන ව්‍යාපෘතිය යන ව්‍යාපෘති 02 ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 269.35ක් පොල් වගාකිරීමේ මණ්ඩලයට ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැයකළ මුදල රු.මිලියන 257.09ක් වූ බැවින් රු. මිලියන 12.26ක් හෙවත් සියයට 4.5ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ආ) පොල් වගාකළ හැකි ඉඩම් තෝරා ගෙන ඒවායේ පොල් වගාව අලුතින් ආරම්භ කර එම ඉඩම් වාණිජ පොල් ඉඩම් බවට පත් කිරීම හා දැනට පවතින පොල් ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමටත්, එමඟින් පොල් ඵලදාව වැඩිකර ගැනීමේ අරමුණින් පුරන් කුඹුරු අක්කර 2500 ක් ඵලදායී වාණිජ ඒකක බවට පත් කිරීම සඳහා 2021 වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.100,000,000 ක මුදලක් මණ්ඩලයට වෙන් කර පසුව අක්කර 380 ක එම කටයුතු කිරීමට අනුමත කරගෙන තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අක්කර 03 ක රජයේ ඉඩම්ද අක්කර 27.5 ක පෞද්ගලික ඉඩම්ද වශයෙන් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 8ක ප්‍රගතියක්පමණක් මණ්ඩලය විසින් ළඟාකරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය මඟින් ගොවීන්ට පොල් පැළ හා අක්කරයකට රු.80,000 ක මුදල් සහනාධාර ලබා දීමට අපේක්ෂා කළද මෙම කාර්යය සිදුකිරීමටද මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(ඇ) මාතර, ගාල්ල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 03හි කොළ මැලවීමේ හා කුණුවීමේ රෝගී කලාපයන්හි2008 සිට2021 දක්වා කාලපරිච්ඡේදය තුළ රෝගී පොල් ගස් 332,075 ක් හඳුනාගෙන ඉන් ගස් 309,622 ක් ඉවත් කර තිබුණු අතර ගස් 285,715 ක් සඳහා රු.610,275,180 ක් වන්දි මුදල් ලෙස ලබා දී තිබුණි.මෙම රෝගය හඳුනාගෙන අවුරුදු 14ක් ගතවී තිබුණද , දකුණු පළාත තුළින් මෙම රෝගය මර්දනය කිරීමට හෝ පාලනය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද නොහැකි වී තිබුණුඅතර, රෝගී කලාපය තුළ රෝගී ලක්ෂණ පෙන්වන පොල්ගස් හා පැළ කපා ඉවත් කිරීම පමණක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) වැලිගම කොළ මැලවීමේ හා කුණුවීමේ රෝග මර්දනය කිරීමේ ව්‍යාපෘතියක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ දී අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.50,360,000 ක මුදලක් මණ්ඩලයට වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.17,720,000 ක් පමණක් වියදම් කර තිබුණුබැවින් අනුමත ප්‍රතිපාදනයෙන් රු.32,640,000 ක් හෙවත් සියයට 65ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ඉ) 2021 ක්‍රියාකාරී සැලැස්ම අනුව වැලිගම පොල් ගස් කුණුවීම හා මැලවීමේ රෝග මර්දන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළදී රෝගී කලාපය ලෙස හඳුනාගෙන තිබුණු මාතර, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනෙහි ග්‍රාම නිලධාරී වසම් 408 ක ඉඩම් පරීක්ෂා කර රෝගී ගස් හඳුනාගෙන සලකුණු කිරීමට ඉලක්ක කර තිබුණු අතර ඒ වෙනුවෙන් රු.15,640,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එසේ වුවද දිස්ත්‍රික තුනෙහි ග්‍රාම නිලධාරී වසම් 257ක ඉඩම් පරීක්ෂා කර රෝගී ගස් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) රෝගී කලාපය පිහිටි දිස්ත්‍රික්ක තුනෙහි රෝගී ගස් කපා දැමූ ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය නහාසිටුවීම සඳහා කොළ කුන්දිරා හා වැලිගම රෝගයට ඔරොත්තු දෙන ප්‍රතිරෝධී පොල් පැළ සිටුවීම අපේක්ෂා කර තිබුණු නමුත් රෝගය ආරම්භ වූ 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කපා ඉවත් කරන ලද පොල්ගස් සංඛ්‍යාව ආසන්න වශයෙන් 309,622 ක් වුවද එයට සාපේක්ෂව අලුතින් ලබාදුන් ප්‍රතිරෝධී පොල් පැළ සංඛ්‍යාව 88,478ක් හෙවත් සියයට 28ක් වැනි අඩු ප්‍රතිශතයක් වූ අතර 2020,2021 හා 2022 වර්ෂවලදී ප්‍රතිරෝධී පැළ කිසිවක් ලබාදී නොතිබුණි.

(උ) පොල් වගාකිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනයේ ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයේ පවතින පැළ තවාන ප්‍රතිරෝධී නව දෙමුහුම් බීජ පැළ තවානක් බවට පුළුල් කිරීම කළ යුතු වුවද විගණිත දින වන විට අවුරුදු 06ක් ගත වී තිබුණද වැලිගම ස්ථාපිතකර ඇති බීජ උයනේ එවැනි ප්‍රතිරෝධී දෙමුහුම් බීජ පැළ 3,193ක් වැනි සුළු සංඛ්‍යාවක් පමණක් නිෂ්පාදනය කර බෙදා හැර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී ණය ලබාදීම යටතේ පොල් ඉඩම් අක්කර 1,122 ක වාරිමාර්ග පද්ධති ස්ථාපිත කිරීමට රු.59,610,000 ක මුදලක් වෙන් කර තිබුණද අපේක්ෂිත පරිදි සැලසුම්කළ ප්‍රාදේශීය කාර්යාල 15ක අක්කර 508 ක වාරිමාර්ග පද්ධති ස්ථාපිත කර නොතිබුණි.

(එ) 2019 වර්ෂයේදී කෑගල්ල හා ගම්පහ දිස්ත්‍රික්ක ආශ්‍රිතව පොල් වගාවට "සුදු මැස්සා" පළිබෝධකයාගෙන් සිදුවන ග්‍රහනය2020 වර්ෂයේදී වැඩිවී ගම්පහ, කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල සුදුමැස්සාගේ ඉහළ ගහන ඝනත්වයක් දක්නට ලැබුණු අතර , මේ වන විට ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය කාර්යාල 13ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 132 ක් දක්වා ව්‍යාප්ත වී තිබුණ ද, හානිය පාලනය සඳහා ප්‍රමාණවත් තරම් දියර ඉසින යන්ත්‍ර නොමැති වීම හා ශ්‍රීස් ආලේප කිරීම උසින් වැඩි පොල් ගස් සඳහා ප්‍රායෝගිකව සිදුකිරීමට අපහසුවීම වැනි හේතූන් මත රෝගය මර්ධනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඒ) මණ්ඩලයේ ප්‍රධාන තනතුරු 3ක් වූ සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) යන තනතුරු සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවැතුණි. යථෝක්තනියෝජ්‍යසාමාන්‍යාධිකාරි තනතුරු දෙක 2020 වර්ෂයේ දී ද පුරප්පාඩුව පැවතුන ද , සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) 2011 හා 2017 වර්ෂ වලදී නළ ළිං ව්‍යාපෘතිය සඳහාලැබී ඉතිරි වූ රු.236,324 ක් ද පොහොර සහනාධාර ව්‍යාපෘතිය සඳහා ලැබී ඉතිරි වූ රු.568,452 ක් ද වශයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් ලැබූ එකතුව රු.798,776 ක් අභාවිතව බැංකු ගිණුම්වල පැවතුණි.

(ඕ) තැඹිලි වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත 2020 වර්ෂයේ දී ලබාදුන් රු.මිලියන 25 ක් අදාළ කාර්ය වෙනුවෙන් නොයොදා සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

(ක) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ පොල් පර්යේෂණ ආයතනය සතු මඩකලපුව, කුරුණෑගල, අම්පාර, යාපනය වැනි දිස්ත්‍රික්කවල පිහිටි ඉඩම් වල පොල් උයන් 9ක් වසර 50 කට ආසන්න කාලයක සිට පොල් වගාකිරීමේ මණ්ඩලය විසින්පවත්වාගෙන ගියද මෙම ඉඩම් විධිමත් පරිදි පවරා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය තෙක් මණ්ඩලයට නොහැකිවී තිබුණි.

(ග) මණ්ඩලයේ නිලධාරීන්ගේ හා සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් මණ්ඩලය තුළ වෙනම අරමුදලක් ලෙස පවත්වාගෙන යන අතර, අර්ථසාධක අරමුදලේ රාජකාරී කළ නිලධාරීන් හතරදෙනෙකු විසින් 2015 – 2021 අතර කාලය තුළ අරමුදලේ චෙක්පත් 50 ක් තමන්ගේ නමින් හා ඥාතීන්ගේ නමින් ලියා රු.73,839,369 ක මුදල් වංචා කර තිබුණු බව පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය විශේෂ විමර්ෂණයක් මඟින් අනාවරණය කරගෙන තිබුණි. අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත නොකිරීම, අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබීම, ගිණුම් පොත් පත් හා ලේඛන යාවත්කාලීන කර නොතිබීම , මූල්‍ය පාලන බලතල පැවරීමකින් තොරව නිලධාරීන්ට වසර ගණනාවක් අරමුදලේ එකම කාර්යයක් සිදුකිරීමට ඉඩකඩ සලසා දී තිබීම හා අරමුදලේ කටයුතු කම්කරු කොමසාරිස්ගේ අවධානයට යොමුකර නොතිබීම යනාදී කරුණු අනුව අරමුදලේ පාලක සභාව සිය වගකීම නිසි ලෙස ඉටුකර නොතිබීම මෙම වංචාවට හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. වංචා කළ මුදලින් රු.3,790,050ක් අරමුදලේ සේවය කළ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දී අයකරගෙන තිබීම හා නිලධාරීන් හතර දෙනෙකුගෙන් තිදෙනෙකු සේවයෙන් පහ කර ඇති අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බී/4515/21 අංක යටතේ කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඔවුන් තිදෙනා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. තවත් එක් නිලධාරියෙකු වෙනුවෙන් විනය පරීක්ෂණය අවසන් කිරීම පමණක් සිදුකර තිබුණි.

(ච) පොල් වගා කිරීමේ මණ්ඩලයට ද්විතික පදනම මත අනුයුක්ත කර තිබුණු සාමාන්‍යාධිකාරිවරියට ලබා දුන් කුලී නිවසට 2021 වර්ෂයේ දී රු.420.000 ක් සහ එම නිවසට පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලී බඩු මිලදී ගැනීමට මණ්ඩලය විසින් රු.372,149 ක් වියදම් කර තිබුණි. 2020 ජනවාරි 05 දිනැති අංක PED/A/CCB/1/2 (i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව සාමාන්‍යාධිකාරී තනතුර ප්‍රධාන කාර්යාලයට සීමා වූ තනතුරක් බැවින් නිල නිවාස

සැපයීමේ හෝ පාරිභෝජ්‍ය භාණ්ඩ ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් අමාත්‍යාංශ ලේකම්ගේ 2022 පෙබරවාරි 22 දිනැති අංක SMCKP/IA/CCB දරන ලිපිය අනුව මෙම කාරණය මත පොල් වගා කිරීමේ මණ්ඩලයට සිදු වී ඇති අලාභය සාමාන්‍යාධිකාරීගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණද, නිටපු සාමාන්‍යාධිකාරීගෙන් රු.7,200 ක මුදලක් පමණක් අයකර නිලධාරිනිය 2021 දෙසැම්බර් 20 දින සේවයෙන් මුදාහැර තිබුණි.

(ඡ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.8.2 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මණ්ඩලයේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් ඇතුළුව නිලධාරීන් 27 දෙනෙක් සඳහා 2011 නොවැම්බර් මස සිට 2015 ජනවාරි මස දක්වා රු.17,186,549 ක කම්කරු දීමනාවක් මුදලින් ගෙවා තිබුණි. මෙමඟින් මණ්ඩලයට සිදු වූ අලාභය මේ දක්වා අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

To achieve a high living standard to the coconut producer through increasing the coconut production by means of an effective advisory & extension service and development assistant to increase the productivity of coconut land while meeting the domestic consumer demand and export requirement.

Coconut Cultivation Board

"Kapthurupiyasa"
No. 9/428, Denzil Kobbekaduwa Mawatha,
Battaramulla
011-2861331 / 011-5635623
www.coconutsrilanka.lk